| | | මාතලේ රෝහල ... ... | 1/8 |
| | | මාතලේ සෞ. වෛ. නි. ... ... | 1/8 |
| | | මාතලේ දන්ත චිකිත්සාගාරය ... | 1/8 |
| | | අලුවිහාරේ ම. බෙ. හල ... ... | 2 |
| | | ගුරුබැබිල ම. බෙ. හල ... ... | 6 |
| | | රත්තොට සෞ. වෛ. නි. ... | 8 |
| | | රත්තොට රෝහල ... ... | 8 |
| | | උතුරු මාතලේ මා. නිවස ... ... | 9 |
| | | යටවත්ත මා. නිවස ... ... | 10 |
| | | ඕවිලිකන්ද මා. නිවස ... ... | 5 |
| | | පල්දෙණිය ම. බෙ. හල ... ... | 11 |
| | | ගම්මඩුව ම. බෙ. හල ... ... | 14 |
| | | නාලන්ද රෝහල ... ... | 16 |
| | | වහකෝට්ටේ ම. බෙ. හල ... ... | 20 |
| | | මාදිපොල රෝහල ... ... | 18 |
| | | කෝන්ගහවෙල රෝහල ... ... | 23 |
| | | ඉලුක්කුඹුර මා. නිවස ... ... | 24 |
| | | ලග්ගල පල්ලේගම රෝහල ... | 52 |
| | | විල්ගමුව ම. බෙ. හල ... ... | 62 |
| | | මාරක ම. බෙ. හල ... ... | 66 |
| | | හඳුන්ගමුව ම. බෙ. හල ... ... | 72 |
| උකුවෙල | ... ... ... ... | උකුවෙල ම. බෙ. හල ... ... | 1/8 |
| | | ලැලිඅඹෙ ම. බෙ. හල ... ... | 4 |
| | | ඇල්කඩුව ම. බෙ. හල ... ... | 7 |
| **II වන කොටස** | | | |
| ටෙන්ඩර් කැන්පත් මුදල—රු. 100.00<br>ඇප මුදල—රු. 500.00 | | | |
| හිඟුරක්ගොඩ | ... ... ... ... | හිඟුරක්ගොඩ රෝහල ... ... | 1 |
| | | හිඟුරක්ගොඩ සෞ. වෛ. නි. ... | 1 |
| | | ගිරිතලේ මා. නි. ... ... | 7 |
| | | ගල්අමුණ මා. නි. ... ... | 6 |
| | | දිවුලන්කඩවල ම. බෙ. හල ... | 9 |
| | | මැදිරිගිරිය රෝහල ... ... | 16 |
| | | අත්තනකඩවල රෝහල ... ... | 22 |
| | | බකමූන රෝහල ... ... | 27 |
| පොළොන්නරුව | ... ... ... ... | පොළොන්නරුව රෝහල ... ... | 2 |
| | | පරාක්‍රම සමුද්‍රය ම. බෙ. හල ... | 7 |
| | | ඩී. ඕ. පී. 400 රෝහල ... ... | 20 |
| | | පලුගස්දමන දන්ත චිකිත්සාගාරය ... | 4 |
| මනම්පිටිය | ... ... ... ... | මනම්පිටිය මා. නි. ... ... | 1 |
| | | අරලගංවිල ම. බෙ. හල ... ... | 13 |
| වැලිකන්ද | ... ... ... ... | කමන්කඩුව ම. බෙ. හල ... ... | 16 |
| කැකිරාව | ... ... ... ... | දඹුල්ල රෝහල ... ... | 15 |
| | | දඹුල්ල සෞ. වෛ. නි. ... ... | 15 |
| | | කලුන්දෑව ම. බෙ. හල ... ... | 25 |
| හබරන | ... ... ... ... | කිඹිස්ස ම. බෙ. හල ... ... | 13 |
| කලාවැව | ... ... ... ... | ගලේවෙල රෝහල ... ... | 23 |
| | | දේවහුව මා. නි. ... ... | 15 |
| | | අලුත්වැව ම. බෙ. හල ... ... | 29 |

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

1973 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා (මාස 12) තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා කොළඹ 2, තැ.පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාව ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| (I) සැපයීම්/සේවාවන් | (II) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අවසාන දිනය (දහවල් 12ට) | (III) ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කරන දිනය (පෙ.ව 10ට) |
|---|---|---|
| (1) කොළඹ, දියතලාව, වීරවිල සහ රිදියාගම පිහිටි ගුවන් හමුදා කඳවුරුවලට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... | 73.11.29 ... | 73.11.30 |
| (2) කොළඹ සහ කටුනායක පිහිටි ගුවන් හමුදා කඳවුරුවලට පලාපු දර සැපයීම ... ... ... | 73.11.29 ... | 73.11.30 |
| (3) දියතලාව, චීනවරාය ගුවන් හමුදා කඳවුරුවලට මෙට්ට, කොට්ට, කුෂන් නැවත සකස් කිරීම ... ... | 73.11.29 ... | 73.11.30 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබාගත හැකි රු. 75/- ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙන් II වැනි තීරයෙහි දක්වා ඇති දිනයන්හි දහවල් 12.00 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්දිස්,
ගුවන් කොමදෝරු
ගුවන් හමුදාධිපති.

11-314—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## 1974 මුදල් වර්ෂය තුල වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

මෙහි පහත අත්සන් කරනු ලබන මා විසින් වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1974 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973 නොවැම්බර් මස 28 වෙනි දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයින්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයැයි තීරණයකර ඇත. :—

| සැපයුම | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. | | ඇප තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) මී හරක් හම් | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ආ) එළ හරක් හම් | ... ... | 20 | 0 | ... | 300 | 0 |
| (ඇ) රබර් පතුල් සහ විලුම් | ... ... | 20 | 0 | ... | 300 | 0 |
| (ඈ) මුස්න මිටි | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඉ) පිරිසිදු ඉරටු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඊ) ගල්ලැහැ පත් | ... ... | 20 | 0 | ... | 300 | 0 |
| (උ) පීරපු කොහු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඌ) ගුදිරි කොහු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (එ) මාදම්පා වේවැල් | ... ... | 20 | 0 | ... | 300 | 0 |
| (ඒ) පොල්කටු අඟුරු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඔ) බේකරි මුහුන් | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඕ) බ්‍රෙඩ් ඉම්පෲවර් | ... ... | 20 | 0 | ... | 200 | 0 |

විශේෂ විස්තර :—මෙම ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයට ගෙනැවිත් භාරදිය යුතුයි.

(අ) පාවහන් සෑදීම සඳහා හොඳින් කෙලින් පදම්කළ ඒවා විය යුතුයි. වියලීම් බර වශයෙන් 5% අඩුකරනු ඇත.

(ආ) හොඳට වියලුනු, පාවහන් සෑදීම සඳහා හොඳින් කෙලින් පදම්කළ ඒවා විය යුතුයි. වියලීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(ඇ) රබර් පතුල්—දිග නොයෙක් ප්‍රමාණයන්ගෙන් වියයුතුයි. රබර් විලුම් මිම් ප්‍රමාණයන් 2½" සිට 4" දක්වා වූ ප්‍රමාණයන්.

(ඈ) දිගින් අඩි පහකට (5) නොඅඩු, මේරූ සවිමත් කෙලින් ලී වියයුතුයි. දවට, අටවේරියා, කැබැල්ල සුදුසුයි. මිටක වට රවුම් අඟල් තුනේ (3) සිට 3½ දක්වා විය යුතුයි.

(ඉ) අඩි තුනක් (3) දිග මේරූ, වියලි පොල් කොළ සූරා පිරිසිදු කරන ලද ඒවා විය යුතුයි. වියළීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(ඊ) දිගින් අඩි තුන හමාරට (3½) නොඅඩු පැදුරු විවීම සඳහා සුදුසු මහත ඒවා වියයුතුයි. වියළීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(උ) ඉතා හොඳට තෙලන ලද වියළි, මුස්න සහ බුරුසු සෑදීමට සුදුසු ඒවා වියයුතුයි. වියළීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(ඌ) හීන් කෙඳි සහිත කොහුබත් නොමැති ගුදිරි සෑදීමට සුදුසු නො. 1 ඒවා විය යුතුයි. වියළීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(එ) වේවැල් හොඳට වියලුනු ඇඳ, පුටු විවීමට සහ කුඩා සෑදීමට තෝරාපු ඒවා වියයුතුයි. දිගින් අඩි හතකට (7) නොඅඩු වියයුතුයි. වටප්‍රමාණය අඟල් ½ සිට අඟල් 1½ වැඩි නොවිය යුතුයි.

(ඒ) මඳ සවනට දවුණු, දූවිලිවලින් තොර ඒවා වියයුතුයි. ප්‍රමාණය ඉක්මවා පිලිස්සී ඇති පොල්කටු අඟුරු සහ හතරැස් අඟල් බාගයට (½) අඩු කැලි භාරගනු නො ලැබේ. දූවිල්ල සඳහා 5% සිට බර ප්‍රමාණයන් අඩුකරනු ලැබේ.

(ඔ) සීල්කොට ඇසුරූ ටින් විය යුතුයි.

(ඕ) බ්‍රෙඩ් ඉම්පෲවර් සීල් කොට ඇසුරූ පැකට්වලින් යුක්ත පාන් පිලිස්සීම සඳහා සුදුසු ඒවා විය යුතුයි.

5. ඉහත 3 වෙනි ඡේදයේ දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම්කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ ලිපිනය ලියා දිග ලියුම් කවරයක බහා පහත අත්සන් තබන අයගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත. රබර් පතුල් සහ විලුම් සැපයීමේදී ලංකා විද්‍යාත්මක හා පර්යේෂණ ආයතනය මගින් පනවා ඇති නියමිත ද්‍රව්‍ය ප්‍රමාණයන්ට අනුකූලව එම රබර් පතුල් සහ විලුම් සාදා තිබියයුතු බවට එම ආයතනයේ අධ්‍යක්ෂකගෙන් ලබාගත් සහතිකයක් සමග ආදර්ශක ඉදිරිපත් කළ යුතුය. එම ආදර්ශකවල ලං.වි.හා.ප. ආයතනයේ මුද්‍රාවද වැදී තිබිය යුතුය.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ:—

(අ) සමුපකාර තොගවෙළඳ ආයතන

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් ඉදිරිපත්කළ යුත්තේ ඒ සඳහා නියමිත ෆෝරමයක් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1973 නොවැම්බර් මස 27 දින ප.ව. 2.00 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත් මේ ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්යාලයේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත්, තැන්පත් කළ හැකි බවත් සලකනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයක් සීල්තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙළවරේ "............... සැපයීම් සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන්කොට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පහත අත්සන්කරන ලද අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළහැක.

6. ඉහත නම් කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරණ අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරණ විට ඒවායේ නම සහ තම ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්‍යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන.

(ආ) වෙනත් ආණ්ඩුවට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරණ ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත පෝර්මයන් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1973 දෙසැම්බර් මස 11 වැනි දින ප. ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත්කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල්, කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්‍යාලයේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සලකණු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙළවරේ " ......... සැපයීම සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම් වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනසක් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින් අත්සන් යොද සැබෑ බවට සහතික කළ යුතුයි.

11. වර්ෂ 1973 දෙසැම්බර් 12 වැනි දින පෙරවරු 10.35 ට පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාළසීමාව තුළ අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වුවහොත් එම කාළසීමාව ඉක්මවා සැපයීම ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකි වන සැපයීම් කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙනත් මාර්ග වලින් ලබා ගැනීමේ අයිතිය මීගමු බන්ධනාගාර අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරනලද කාර්යය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය මීගමු බන්ධනාගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුළත දී මීගමු බන්ධනාගාර අධිකාරි සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාළ සීමාව තුළ කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැන ගැනීමට ඇවැසි නම් පහත අත්සන් කරන අයගෙන් එය ලබාගත හැක.

ආර්. ඩී. ඩක්වර්ත්
බන්ධනාගාර අධිකාරි, මීගමුව.

1973 ඔක්තෝබර් මස 29 වැනි දින,
මීගමුව බන්ධනාගාරයේ දීය.

11-323—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1974 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1974.01.01 වනද සිට 1974.12.31 වනද දක්වා වකවානුව තුළ දුම්රියපොළෙන්/පොළවලින්/පොළවලට/පොළට, ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාලය යෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමුපකාර සමිතිවලිනුත් පුත්තලමේ සෞ. සේ. අධිකාරි තැන ටෙන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටෙන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100ක මුදලක් ළඟමැ ඇති කච්චේරියේ පුත්තලම සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙනැ ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1973.11.29 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය :—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කළුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැළකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයයකින්ද ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර්පත්‍ර " බඩු ඇදීම සඳහා ටැන්ඩරය " යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සළකුනක් තබා පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත පිට නම් ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර්පත්‍ර 1973.11.30 වනද පෙරවරු 10ට පෙර පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත ලැබෙනසේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන්, කැමති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත් අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවලැ ලේකම්/ගණකාධිකාරි වෙත බාර දී ඊට ලදු පතක් ලබා ගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විටැ දක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 73.11.30 වනද පෙරවරු 10 ට සෞ. සේ. අධිකාරි කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම්ලත් නියෝජිතයින්ට හෝ තමන් කැමති නම්, පුත්තලම සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසාගෙන ඔහුගේ අවසරය පිටැ, ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර් බාර ගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර්පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

10. පුත්තලම සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේ දී ටැන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයින් පමණකි. මෙහිදී " ලාංකිකයා " යනු වෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි. පුත්තලම සෞ. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම් කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවියට ගැනීම

කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාක් සේ සලකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොට, එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥාපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම, එකතු කිරීම, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත් කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. පුත්තලම සෞ. සේ. අධිකාරිතැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 300 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව පුත්තලම සෞ. සේ. අධිකාරී විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවුවොත් හෝ අපොහොසත් වුවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකව්, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර් කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. පුත්තලම සෞ. සේ. අධිකාරිගේ අවසරයක් කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. පුත්තලම සෞ. සේ. අධිකාරි තැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/ තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දකිමක්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස පුත්තලම සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටැකදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරු වෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වුවහොත් නැත්නම් අපොහොසත් වුවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වුවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළ වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදාළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතහොත්, කිසිදු ටැන්ඩරයක් සලකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. දුර ප්‍රමාණ තිබවුවෙන්.—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේ. මෙකී දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.—කොන්ත්‍රාත් කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවොත් හෝ හොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්, හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදු වන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොට, අලාභ වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. දක්විය යුතු මිළ ගණන්.—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී—1 උප ලේඛනයෙහි දක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,

දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,

තුන්වනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,

සිව්වනුවැ රාත්තල් 84 ට වැඩි හොණ්ඩර 1 දක්වා ද,

පස්වනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,

හයවනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,

හත්වනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,

අටවනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,

නවවනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,

දහවනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) මුදල් ගෙවනු ලබන්නේ ඉතා වැඩි කොටස් දක්වෙන මුළු බර ප්‍රමාණයමැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

බී 1—හොණ්ඩර 4ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරම ගෙන යෑම සඳහා මතු සටහන් වැටි 4 යටතේ බී—2 උපලේඛණ යෙහි මිළ ගණන් දක්විය යුතුයි.

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා,

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා,

(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා,

(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යෑම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරම සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතු අනුප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නො ලැබේ.

සී (i) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුවේනම් ඒවායේ ගෙවීම බී—1 උපලේඛණය යටතේ විය යුතුයි.

සී (ii) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිනම් ඒවායේ ගෙවීම් බී—2 උපලේඛණය යටතේ විය යුතුයි.

සී (iii) එක් බඩු තොගය යනුවෙන් මේ වගන්තියෙන් අදහස් වන්නේ දුම්රිය ස්ථානයේදී ඕනෑම දිනයක කොන්ත්‍රාත්කරුට බෙද හැරීම පිණිස භාර දෙන ලද මුළු බඩු ප්‍රමාණය හා ඕනෑම දිනයක දුම්රිය ස්ථානය වෙත ගෙන යාම පිණිස ආයතනවලින් භාර දෙන ලද මුළු බඩු ප්‍රමාණයයි.

ඩී—සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණතා විය යුතු අතර යම්බඳු බර භාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩිවිය යුතු නොවේ.

27. මෙම දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

ඇම්. වී. ජී. බලසේකර,
පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරී.

1973.10.26 වැනි දිනය.

————————,
දිනය : 1973.................. නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

————————,
දිනය : 1973.................., ටැන්ඩර්කරුගේ අත්සන.

**1974 ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියැවෙන උපලේඛනය**

**පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය**

**පුත්තලම් සෞඛ්‍ය සේවා අධිකාරය—දුම්රිය පොලෙන්/පොලට ආයතනවලින්/කාර්යාලවලින්/ආයතනවලට/කාර්යාලවලට දුර ප්‍රමාණය දල වශයෙන්**

**I වන කොටස—පුත්තලම් දිස්ත්‍රික්කය**

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන් ස්ථානයට | | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|---|---|
| පුත්තලම | ... | පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය සහ ළදරු සුභසාධක චිකිත්සාගාරය, මන්නාරම් පාර, පුත්තලම | ... | 1 |
| | | දිසා රෝහල, පුත්තලම | ... | ½ |
| | | ළය රෝහල, පුත්තලම ... | ... | ½ |
| | | සෞ/බා වෛද්‍ය නිලධාරී, පුත්තලම | ... | 1 |
| | | ග්‍රාමීය රෝහල, කොට්ටුකච්චිය | ... | 10 |
| | | දි. රෝහල, ආණමඩුව ... | ... | 16 |
| | | ම. බෙ. හල, තබ්බෝව | ... | 9 |
| | | ම. බෙ. හල, කරතිව් ... | ... | 15 |
| | | ම. බෙ. හල, වන්නාතවිල්ලු | ... | 13 |
| මදුරන්කුලිය | ... | ම. බෙ. හල, මදුරන්කුලිය | ... | 4 |
| | | මාතෘ නිවාසය, මහකුඹුක්කඩවල | ... | 11½ |
| පාලාවි | ... | ග්‍රා. රෝහල, කල්පිටිය ... | ... | 25 |
| | | ම. බෙ. හල සහ මාතෘ නිවාසය, මාම්පුරි ... | | 7 |
| | | ම. බෙ. හල, තලවිල ... | ... | 18 |
| මුන්දල් | ... | පර්යන්ත ඒකකය, මුන්දල් | ... | ½ |
| | | ම. බෙ. හල, කොට්ටන්තිව් | ... | 8 |

දුම්රිය පොලෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන් ස්ථානයට — ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට — කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම්

**II වන කොටස—හලාවත දිස්ත්‍රික්කය**

| | | | | |
|---|---|---|---|---|
| බෝලවත්ත | ... | සෞ. වෛ. නි. කාර්යාලය, දන්කොටුව ... | | 3 |
| | | පර්යන්ත ඒකකය, දන්කොටුව | ... | 2 |
| | | ම. බෙ. හල, නයිනමඩම | ... | 3 |
| | | ම. බෙ. හල, මැල්ලව ... | ... | 9 |
| ලුනුවිල | ... | ම. බෙ. හල, කොස්වත්ත | ... | 5 |
| | | ම. බෙ. හල, පොතුවටවන | ... | 4 |
| | | ම. බෙ. හල, ලුනුවිල ... | ... | ½ |
| නාත්තන්ඩිය | ... | ම. බෙ. හල, නාත්තන්ඩිය | ... | ½ |
| | | සෞ. වෛ. නි. කාර්යාලය, මාරවිල | ... | 3 |
| | | දිසා රෝහල, මාරවිල ... | ... | 3½ |
| | | ම. බෙ. හල, වලහපිටිය | ... | 3½ |
| කුඩාවැව | ... | ම. බෙ. හල, කුඩාවැව ... | ... | 4½ |
| මාදම්පේ | ... | පර්යන්ත ඒකකය, මාදම්පේ | ... | 1 |
| | | බෙහෙත් ගබඩාව, මාදම්පේ | ... | 1 |
| | | ම. බෙ. හල, කඹගල්ල ... | ... | 5 |
| | | පර්යන්ත ඒකකය, ගල්මුරුව | ... | 3 |
| හලාවත | ... | මූලික රෝහල, හලාවත | ... | ½ |
| | | සෞ. වෛ. නි. කාර්යාලය, හලාවත | ... | ½ |
| | | ම. බෙ. හල, කොක්කාවල | ... | 7 |
| බංගදෙනිය | ... | ම. බෙ. හල, පල්ලම ... | ... | 12 |
| බහකුඹිඹය | ... | ම. බෙ. හල, ආනවිල්ලුන්දව | ... | 2 |
| | | ම. බෙ. හල, උඩප්පුව ... | ... | 4 |
| | | ම. බෙ. හල, කටුපොත ... | ... | 4 |
| | | ම. බෙ. හල, මුදලක්කුලිය | ... | 14 |

11–283—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි මස 1 වැනි ද සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළවෙනි තීරයෙහි සඳහන්වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල සිට සෞඛ්‍ය කාර්යාලවලටත් සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලටත් පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර පුත්තලමේ සෞඛ්‍ය අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙම උපලේඛනයෙහි දෙවෙනි ඡෙදයෙහි සඳහන් පරිදි රු. 100 ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වෙලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය අධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ලබා ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම හා ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මවිසින් බලය පවරනු ලබන නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොමැතිනම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි තුන්වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අවසන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දැක්වෙන II වැනි ඡෙදයෙහි සඳහන් කුමන කාර්‍යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඇම්. වී. ඒ. බලසේකර,
සෞඛ්‍ය සේවා අධිකාරී, පුත්තලම.

1973 ඔක්තෝබර් මස 26 වැනි දින,
පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

උපලේඛනය

| | (1) සේවය | (2) ප්‍රදේශය | (3) සැපයිය යුතු ප්‍රමාණය මසකට පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|---|
| 1. | මාරවිල සහ දන්කොටුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්‍යාලයේ සිට එම වෛද්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථාන වලට | මාරවිල සහ දන්කොටුව ... | 11,000 ... | 73.11.30 පෙ. ව. 10 ට |
| 2. | හලාවත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්‍යාලයේ සිට එම වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට | හලාවත ... | 10,000 ... | එම |

11–284—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

**රේගු වෙන්දේසියක්**

පහත සඳහන් බඩු 1973 නොවැම්බර් මස 18 වෙනි ඉරිදා පෙරවරු 9.00 ට රේගුවේ ගමන් බඩු කාර්යාලයේ පර්යන්ත වේදිකාවේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසි කරනු ලබන බඩු 1973 නොවැම්බර් මස 17 වෙනි දින උදේ 10.00 සිට දහවල් 12.00 දක්වා පරීක්ෂා කිරීම සඳහා තබනු ඇත.

අත් ඔරලෝසු මිලදී ගත හැක්කේ වෙන කෙනෙකුට පැවරිය නොහැකි කොන්දේසිය යටතේ එක් අයෙකුට එකක් පමණි.

විකිණීමේ කොන්දේසි සඳහා 1972 අගෝස්තු මස 4 වෙනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

ඩී. පී. මීගොඩ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : නිවාරණ/විකිණීම්/84/73,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.

අංක 1 සිට 128 දක්වා මහතුන්ගේ සී-කිං 'පා වර්ලියුබා' අත් ඔර්ලෝසු,

අංක 129 සිට 132 දක්වා මහතුන්ගේ 'සීකෝ' සී ලයන් අත් ඔර්ලෝසු,

අංක 133 මහතුන්ගේ 'හෙන්රි සැන්ඩෝස්' ඔර්ලෝසුවක්,

අංක 134 මහතුන්ගේ 'සැන්ඩෝස්' ඔර්ලෝසුවක්,

අංක 135, 136 මහතුන්ගේ 'සීකෝ' සී ලයන් ඔර්ලෝසු,

අංක 137 මහතුන්ගේ 'හැන්රි සැන්ඩෝස්' අත් ඔර්ලෝසුවක්,

අංක 138 සිට 141 දක්වා මහතුන්ගේ 'සීකෝ' සී ලයන් අත් ඔර්ලෝසු,

අංක 142 මහතුන්ගේ 'හැන්රි සැන්ඩෝස්' ඔර්ලෝසුවක්,

අංක 143 සිට 145 දක්වා මහතුන්ගේ 'සීකෝ' සී ලයන් ඔර්ලෝසු,

අංක 146 මහතුන්ගේ හෙන්රි සැන්ඩෝස් ඔර්ලෝසුවක්,

අංක 147 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසු පටි 6 ක්,

අංක 148 නෝනා මහතුන්ගේ 'සීකෝ' සෝලාර් පටි සහිත ඔර්ලෝසුවක්,

අංක 149 නෝනා මහතුන්ගේ 'ලූසිනා' අත් ඔර්ලෝසුවක්,

අංක 150, 151 මහතුන්ගේ 'කැමි' අත් ඔර්ලෝසු,

අංක 152 නෝනා මහතුන්ගේ 'සීකෝ' පටි සහිත ඔර්ලෝසුවක්,

අංක 153 නෝනා මහතුන්ගේ 'රෝමර්' (ක්‍රියා විරහිත) ඔර්ලෝසුවක්,

අංක 154 මහතුන්ගේ 'රෝමර්' (ක්‍රියා විරහිත) ඔර්ලෝසුවක්,

අංක 155 නෝනා මහතුන්ගේ 'සීකෝ' පටි සහිත ඔර්ලෝසුවක්,

අංක 156 හෙදි 'සීකෝ' ඔර්ලෝසුවක්,

අංක 157 මහතුන්ගේ 'සීකෝ' ඔර්ලෝසුවක්,

අංක 158 මහතුන්ගේ 'සිටිසන්' ඔර්ලෝසුවක්,

අංක 159 නෝනා මහතුන්ගේ 'ටොනිකා' ඔර්ලෝසුවක්,

අංක 160 මහතුන්ගේ පාවිච්චි කරන ලද 'රෝමර්' ඔර්ලෝසුවක්,

අංක 161 මහතුන්ගේ 'කැස්ටෝ' ඔර්ලෝසුවක්,

අංක 162 —එම— (ක්‍රියා විරහිත)

අංක 163 දියමන්ති 18 ක් ඔබ්බන ලද කරාබු කුට්ටමක් (කැරට් 1 ක් පමණ),

අංක 164 දියමන්ති 16 ක් ඔබ්බන ලද නාසයේ පලඳින ආභරණ කුට්ටමක්.

11–276—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව**
**(අම්පාර ජලසම්පාදන යෝජනා ක්‍රමය)**

කොටස් කරන ලද හිස් බිලිච්චි පව්ඩර් ටින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1973 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා පෙරවරු 8.00 ට අම්පාර සමූහ ජලසම්පාදන යෝජනා ක්‍රම භාර ප්‍රාදේශීය නිලධාරි කාර්යාලයේ දී දහයේ (10) කොටස් වශයෙන් සකස් කරන ලද හිස් බිලිච්චි පව්ඩර් ටින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකුණනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

විකිණීමට දහයේ කොටස් වශයෙන් සකස් කරන ලද හිස් බිලිච්චි පව්ඩර් ටින් ඉහත සඳහන් කාර්යාලයේ දී 1973 නොවැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 8.00 සිට පස්වරු 3.00 දක්වා පරීක්ෂා කළ හැක.

මිල දී ගණු ලබන දහයේ කොටස් වශයෙන් සකස් කරන ලද හිස් බිලිච්චි පව්ඩර් ටින් සඳහා මුදල් ඒ අවස්ථාවේම ගෙවිය යුතු බවත් එම හිස්ටින් 1973 නොවැම්බර් මස 23 සිකුරාදා පස්වරු 3.00 ට පෙර ඉවත් කර ගත යුතු බවත් දන්වා සිටිමි. මිලදී ගන්නා එම හිස් ටින් එකී වේලාවට පෙර ඉවත් කර නොගත හොත් ඒ සඳහා දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

ජේ. බී. ඒ. පෙරේරා,
මැඩිබලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන.

11–357—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

### මහෙස්ත්‍රාත් උසාවිය—හෝමාගම

හෝමාගම මහේස්ත්‍රාත් උසාවියට අයත් රාජසන්තක කළ, අයිති වාසිකම් නොකියන ලද හා උසාවියෙන් විකිණීමට නියම කරණ ලද බයිසිකල්, ලී භාණ්ඩ, බැරල්, ප්ලාස්ටික් භාජන, වීදුරු බෝතල්, තඹ කෑලි, මෝටරයක් යනාදී භාණ්ඩ වර්ග කීපයක් 1973. 11. 24 වැනි දින පූ. භා. 10.30 ට මෙම උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ වෙන්දේසිය පටන් ගැනීමට පැය ½ කට පෙර ඉහත කී ස්ථානයේදී පරීක්ෂා කළ හැක.

ගැණුම් කරුවන් විසින් ඉල්ලා මිළට ගත් බඩු මුදල් ගෙවා එවෙලේම ඉවත් කර ගත යුතුය.

මෙම වෙන්දේසිය පවත්වනු ලබන්නේ උසාවියේ පාලන ලේකම් මහත ඉදිරියේ දීය.

විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ පිළිබඳ ලැයිස්තුවක් 1973.11.09 වැනි දින සිට මෙම උසාවියේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

ඇස්. බී. ගුණවර්ධන,
මහේස්ත්‍රාත්, හෝමාගම.

1973 ක්වූ ඔක්තෝබර් මස 29 වැනි දින,
හෝමාගම,
මහෙස්ත්‍රත් උසාවියේ දීය.

11–342—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### අධ්‍යාපන දෙපාර්තමේන්තුව—තංගල්ල

තංගල්ල, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ මිළයට ගැනීම සඳහා ටෙන්ඩර් පත් තංගල්ල, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 11. 30 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් පසු, ටෙන්ඩර් පත්‍ර 1973. 11. 29 වැනි දින පස්වරු 2 දක්වා ලබා ගත හැක. අවශ්‍ය නම්, භාණ්ඩ පරීක්ෂණය සෙනසුරාදා දිනයන්හි කළ හැක:—

1. බයිසිකල් 1 යි.
2. ශ්ලැක් රාත්තල් 9 යි.
3. ළමා පුටු 1 යි.
4. ටෙරස්කෝප් 1 යි.
5. 5" පිත්තල සීනු 14 යි.
6. 6" පිත්තල සීනු 1 යි.
7. වයිම්පීස් ඔරලෝසු 16 යි.
8. දුනු තරාදි 1 යි.
9. කැති තල 1 යි.
10. ඉබ්බන් (එක යතුර බැගින්) 4 යි.

එන්. එල්. බී. ඒප්. කරුණාරත්න,
තංගල්ල, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස 26 වැනිදා,
තංගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

11–293—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### මහෙස්ත්‍රාත් උසාවිය—ත්‍රිකුණාමලය

කල්වෙලා ඇතිව හිමිකම් ඉදිරිපත් නොකළහොත් පහත සඳහන් හිමිකරුවන් නොමැති හා රාජසන්තක කරන ලද භාණ්ඩ 1973 නොවැම්බර් මස 15 වෙනි දින ප.ව. 2.00 ට මඩකලපුවේ ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිට ඉහත සඳහන් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

භාණ්ඩ ගැනීමට සමත්වන ඉල්ලුම්කරුවන් එම ස්ථානයේදීම මුදල් ගෙවා වහාම භාණ්ඩ ඉවත් කර ගත යුතු ය.

කේ. වික්නරාජා
මහෙස්ත්‍රාත්, ත්‍රිකුණාමලය.

1973 ඔක්තෝබර් මස 24 වෙනි දින,
ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

| ම.උ. ත්‍රිකුණාමලය නඩු අංකය | | භාණ්ඩ විස්තර | |
|---|---|---|---|
| 15232 | ... | පාවිච්චි කරන ලද රලේ පාපැදි (ඊඑල් 1178) | 1 යි |
| 10579 | ... | පාවිච්චි කරන ලද මොනරා පාපැදි (01594) | 1 යි |
| ඒආර්/2491/72 | ... | පාවිච්චි කරන ලද හම්බර් පාපැදි අංකය ඒජී 94140 | 1 යි |
| ඒආර්/2490/72 | ... | 1. පාවිච්චි කරන ලද පාපැදි අංකය 34528 | 1 යි |
| | | 2. රජ් පාපැදි (අංකය 56983) | 1 යි |
| ඒආර්/2670/72 | ... | පලුදුවූ පාපැදි (අංකය 89201) | 1 යි |
| 20396 | ... | පලුදුවූ රලේ පාපැදි (අංකය ඩීජේ 2385) | 1 යි |
| ඒආර්/2491/72 | ... | පාපැදි රාමු (අංකය 89201) | 1 යි |
| 13480 | ... | කටුකම්බි රෝල් | 2 යි |
| 20185 | ... | උකු කළ කිරි ටින් | 47 යි |
| 23622 | ... | රාත්තල් 7ක පිත්තල (පයිප්ප) | |
| ඒආර්/2260/73 | ... | වල්ලම | 2 යි |
| 18691 | ... | 1. විටාමෝල්ට් ටින් | 1 යි |
| | | 2. වෝටර්බරිස් කම්පවුන්ඩ් බෝතල් | 1 යි |
| | | පරණ පිහි | 10 යි |
| | | පොරොව | 3 යි |
| | | කියත් | 2 යි |
| | | යකඩ කම්බි | 6 යි |
| | | යකඩ පොලු | 4 යි |

11–378—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

1973 නොවැම්බර් මස 20 දින පූ. භා. 10 ට පවත්වන වෙන්දේසිය පිළිබඳ කොන්දේසි

1. සියළුම ඉල්ලන ගණන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ අනුමැතියට යටත් වේ.

2. ඉතා වැඩිගණනට ඉල්ලන්නා මිළයට ගන්නා වෙයි. ඉල්ලුම් කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර යම්කිසි ආරාවුලක් පැන නැගුන හොත් බඩු නැවතත් වෙන්දේසියේ දමා විකුණනු ලැබේ.

3. වෙන්දේසියේ විකුණන අවස්ථාවේදී සම්පූර්ණ මුදලම එක් වර ගෙවිය යුතුවේ. වෙන්දේසිය අවසානයේ සියළුම විකිණීම් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ අනුමැතියට යටත්ව එදිනම සවස 3.30 ට පෙර ඉවත් කර ගත යුතුය.

4. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ අනුමැතිය නොලැබෙන යම්කිසි භාණ්ඩයක් සඳහා ඉල්ලුම්කරු ගෙවා ඇති මුදල ඔහුට ආපසු ගෙවනු ලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 ඔක්තෝබර් 27 වෙනි දින,
කොළඹ 8,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දීය.



### ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වෙන්දේසියේ විකිණීම

මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ [illegible] 1973. 11. 29 දින උදේ 10 ට ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු

වෙදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

ඉබ් යතුරු විවිධ 22
ලන් තැරුම් 1
ගැල්වනයිස් යකඩ බාල්දි 17
වතුර ෆිල්ටර් 2
කුඩා මිටි 1
තියත් 9
කීතෝල් කියත් 1
වඩු කෝදු 1
බලෝ ලාම්පු 1
හෑන්ඩ් ඩ්‍රිල් 2
කිනිසිරි 1
විදුලි පන්දම් 4
ප්ලයර්ස් 2
වෙල්ඩින් සපත්තු 2
පොත් බඳින් නාත්තේ පිහි 2
තෙල් ඉසිනයක් 1
වරිලර් යකඩ 1
අත් කියත් 1
හැක්සෝ ෆ්‍රේම් 1
බේසන් 1
ඔයිල් කෑන් 1
වතුර ශීතකරණයක් 2
ෂිෆ්ට්ං ස්පැනර්ස් 1
ස්ටොක් ඇන්ඩ් ඩයිස් 1
කතුරු 1
ගැලුම් 2 ටින් 5
ගැලුම් 4 ටින් 8
වී බාර් 1
වින්චෙස්ටර් බෝතල් 150
ගැලුම් 1 බෝතල් 35
මැට්බරණ් 20
බැටරි ඇම්පියර් 60 7 යි
පිරි විවිධ 50
ග්ලෝබ් පිගිතල 40
ගැලුම් 45 බැරල් 63
පින් විවිධ තොග 1 යි
ටයර් 750×20 1 යි
ටයර් සහ ටියුබ් 750×16 4 යි
ටයර් සහ ටියුබ් 670×13 4 යි
විදුලිය අමතර කොටස් තොග 1 යි
වායු සමීකරණ 1
ශීතකරණ 1
රෝල කොම්පොසිසන් (ගම්) තොග 1 යි
බේල් තට්ටු තොග 1 යි
ටින් තහඩු තොග 1 යි

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8,
1973 ඔක්තෝබර් මස 27 දින.

11–316—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවිය

වෙන්දේසියේ විකිණීමයි

දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ ඇති රාජ සන්තක කරන ලද භාණ්ඩ සහ අයිතිකරුවන් විසින් රැගෙන ගොස් නොමැති භාණ්ඩ 1973. 11. 17 වෙනි දින ප. ව. 1 ට දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවි භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් 73.11.12 වන දින සිට දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ ඇන්දීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලැබේ. උසාවියේ දී එම භාණ්ඩ පෙ. ව. 11 සිට බැලිය හැක. භාණ්ඩ මිලදී ගත් වහාම මුදල් ගෙවා රැගෙන යා යුතුයි. සියළුම ගෙවීම් මුදලින් ම කළ යුතුයි.

එෆ්. පී. බී. ප්‍රනාන්දු,
දකුණු කොළඹ මහෙස්ත්‍රාත්.

මහෙස්ත්‍රාත් උසාවිය,
දකුණු කොළඹ,
73.10.10.

11–67—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## 1974 වර්ෂයට (74.01.01—74.12.31) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

1974 ජනවාරි 1 දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල අරක්කු සිල්ලරට විකිණීම සඳහා 1973.11.09 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ අංක 85 ගැසට් පත්‍රයේ පලකරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයන්ටම අදාල එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝර්ම මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම සීල් තබන ලද කවරයක බහා, කවරය වම් පස මුදුනේ (උපලේඛනයේ සඳහන් පරිදි) තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට, 1973 නොවැම්බර් 27 වන දින ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාවට පෙර ත්‍රිකුණාමලය දිසාපතිතුමාට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට ප්‍රථම දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. එක් එක් තැබෑරුම් සඳහා පහත සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන් ටෙන්ඩර් තැන්පත් වශයෙන් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සි ටෙන්ඩරයට යා කල යුතුය.

| තැබෑරුම් අංකය | | ගෙවිය යුතු ප්‍රමාණය |
|---|---|---|
| 1 | ... | රු. 5,000 |
| 2 | ... | රු. 5,000 |
| 3 | ... | රු. 4,000 |
| 4 | ... | රු. 1,000 |

මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

3. තමාගේ පෞද්ගලික නමින්ම සීය ටෙන්ඩර් පත්‍රය ඉල්ලුම් කළ යුතුය. ලාංකික පුරවැසියකු නොවන අයකු විසින් හෝ නියෝජිතයෙකු මාර්ගයෙන් හෝ 1973.11.09 දින අංක 85 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ 1974 වර්ෂය සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිය අනුව නුසුදුස්සෙකුවූ අයෙකු විසින් හෝ ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

4. එක් අයෙකු විසින් එක් තැබෑරුමක් වෙනුවෙන් එක ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් නොකළ යුතු අතර, පස් දෙනෙකුට වඩා එකම ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යුතුය.

5. (1) ටෙන්ඩර්කරුවන් තමන් ටෙන්ඩර් කරන මුදලෙන් අඩුතරමින් 25%කට නොඅඩු වත්කම් සහතිකයක්, එම සහතිකයේ දක්වෙන නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගෙන් ලබාගෙන සෑම ටෙන්ඩරයක් සමඟම ඉදිරිපත් කළ යුතුය. මේ අනුව ටෙන්ඩර් තැන්පත් මුදල කුවිතාන්සියට අමතරව, වත්කම් සහතිකයක්ද සෑම ටෙන්ඩරයකටම අමුණා තිබිය යුතුය.

(ii) කීප දෙනෙකු එකතුව එක ටෙන්ඩරයක් ඉදිරිපත් කරන විට ඔවුන් ටෙන්ඩර් කරන මුදලෙන් 25% කට නොඅඩු නිශ්චල දේපල සඳහා වත්කම් සහතික එක් අයෙකුගෙන් හෝ කීපදෙනෙකුගෙන් ඉදිරිපත් කිරීමට අවකාශ ඇත.

(iii) තැබෑරුම් කීපයකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන්, එක් එක් තැබෑරුමට වෙන් වශයෙන් සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය. කෙසේවුවත් එම ටෙන්ඩර්කරුවන්ගේ වත්කම් සහතික ටෙන්ඩර් ඉදිරිපත් කරන තැබෑරුම්වල ටෙන්ඩර් කරන මුදලෙන් 25% කට නොඅඩු විය යුතුය. වත්කම් සහතිකය පළමුවන ටෙන්ඩරයට යාකොට අනිකුත් ටෙන්ඩර්වල වත්කම් සහතිකය යාකර ඇති ටෙන්ඩරයේ විස්තර සඳහන් කළ යුතුය.

(iv) ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයක්, එම සහතිකයේ ඇතුලත්වූ හෝ එම සහතිකය නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපලක් විකුණා හෝ පවරා නැත්නම්, එම සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක් ඇතුළත වලංගුය. පෙර වර්ෂයකදී ඉදිරිපත් කරන ලද වත්කම් සහතිකයක් නම් එම දේපල බැඳීම්වලින් තොරව ඇති බවට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්තුමාගෙන් ලබාගත් අමතර සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය.

(v) ලබාගත් තනි අයිතියට අදල කාලසීමාව ඉකුත්වනතුරු වත්කම් සහතිකයට ගැනෙන දේපල විකිණීම, උකස් කිරීම, බදු දීම හෝ වෙනයම් අන්දමකින් අයිතිය වෙනස් කිරීම, රේන්දයේ කොන්ත්‍රාත්තුව දෙන ගිවිසුමේ කොන්දේසි කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර පිළිගත් බව දන්වූ වහාම සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ත්‍රිකුණාමලය ආණ්ඩුවේ ඒජන්ත විසින් යථෝක්ත කොන්දේසි අනුව නියම කරන ලද ඇප මුදල වහාම ගෙවා රේන්ද විකිණීමේ කොන්දේසි හා කොන්ත්‍රාත්තුවට අවශ්‍ය මුද්දර සපයමින් අත්සන් කළ යුතුය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ඒ බව දන්වූ වහාම තැබෑරුම පවත්වාගෙන යන ස්ථානය ත්‍රිකුණාමලය දිසාපතිට දන්වා ඒ සඳහා ඔහුගේ අනුමතිය ලබාගත යුතුය. දනට තැබෑරුම පවත්වාගෙන යන ස්ථානයම මේ සඳහා ලැබේයයි පොරොන්දුවක් දිය නොහැක.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර පිළිගත් බව දන්වූ විට නියම කරන ලද ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියොත් ඔවුන් විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමිවූ බව ප්‍රකාශ කරනවාත් හැර එසේ පැහැර හරින්නන්ගේ නම් පුරාබදු බලපත්‍රවලට අදල "පැහැර හරින්නන්ගේ නාමලේඛනයට" ඇතුලත් කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී හැර ජයග්‍රාහී ටෙන්ඩර්කරුවන් විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසුව සියළු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළු ටෙන්ඩර් පත්‍ර හෝ කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත.

10. අංක 1 සිට 4 දරන තැබෑරුම්වලට 1973 නොවැම්බර් 27 දින පෙරවරු 9.30ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම් අවසාන කරනු ලැබේ. එකී වේලාවන්හිදී ටෙන්ඩර්කරුවන් කච්චේරියේදී පෙනී සිටිය යුතුය. ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් පත්‍ර සියල්ල විවෘත කරනු ලැබේ.

| තැබෑරුම් අංකය | | ටෙන්ඩර් භාර ගැනීම නවත්වන වේලාව |
|---|---|---|
| 1 | ... | පෙරවරු 9.30 |
| 2 | ... | පෙරවරු 9.30 |
| 3 | ... | පෙරවරු 9.30 |
| 4 | ... | පෙරවරු 9.30 |

මේ සම්බන්ධ වැඩි විස්තර ඉල්ලුම් කිරීමෙන් ත්‍රිකුණාමලය කච්චේරියෙන් ලබාගත හැක.

11. 1974 වර්ෂය සඳහා අනුමතිය තැබෑරුම් ලැයිස්තුව පහත සඳහන් කර ඇත :—

| තැබෑරුම් අංකය | | ප්‍රදේශය | | කොට්ඨාශය | | තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. | | තැබෑරුම වසන වේලාව ප.ව. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ... | ත්‍රිකුණාමලය නගර සභාව | ... | කොට්ඨාශ අංක 1 | ... | 8.00 | ... | 8.00 |
| 2 | ... | ත්‍රිකුණාමලය නගර සභාව | ... | කොට්ඨාශ අංක 5 | ... | 8.00 | ... | 8.00 |
| 3 | ... | ත්‍රිකුණාමලය නගර සභාව | ... | කොට්ඨාශ අංක 9 | ... | 8.00 | ... | 8.00 |
| 4 | ... | නිලාවැලි ගම් කාර්‍ය සභාව | ... | නිලාවැලි ගම | | 8.00 | ... | 6.30 |

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 ඔක්තෝබර් මස 27 වැනි දින,
ත්‍රිකුණාමලය කච්චේරියේ දී ය.

11–338—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

## 1974 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ තොටුපල් සහ ඇල රේන්ද විකිණීම

1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින තෙක් පහත සඳහන් තොටුපලවල් සහ ඇල වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ සහ එකතු කිරීමේ තනි අයිතිවාසිකම් මිලට ගැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් කළුතර කච්චේරියේ දී 1973 නොවැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.30 තෙක් භාර ගන්නා බව මෙයින් දන්වමි :—

(1) අඟුරුවාතොට
(2) කලවැල්ලාව
(3) කිතුල්ගහවත්ත
(4) රුක්ගහ තොටුපල
(5) හල්වතුර
(6) වෙරළුගස් තොටුපල හෙවත් පොසැස්ටර්
(7) එගොඩඋයන, හේනමුල්ල ගොරකාපොල
(8) ඉඳිගහ තොටුපල
(9) මෝල්කාව
(10) කළුතර පුරාණ ඇල

2. හැකි සෑම අවස්ථාවකදීම තොටුපල් සේවා කටයුතු සමූපකාර සමිතිවලට භාරදීමට වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රය ලියුම් කවරයක බහා සීල් (මුද්‍රාව) තබා එකී ලියුම් කවරයේ වම් පස මුදුනේ කෙලවරෙහි "1974 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද පිළිබඳ ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් මස 28 වැනි දින පෙරවරු 10.30 ට කලින් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත ලැබිය යුතුය. ඉහත කී දින ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට කච්චේරියට පැමිණ සිටිය හැක.

4. රු. 50 ක් තැන්පත් කළ බවට දිසාපති කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු අතර, ටෙන්ඩර් පත්‍රයේ මුල් පිටේ එකී කුවිතාන්සියේ අංකය හා දිනය ලකුණු කළ යුතුය.

5. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට, රේන්දය විකුණන දිනයේදී එනම් 1973 නොවැම්බර් මස 28 වැනි දින ගැනුම් මුදලින් 1/10 ක් එවේලේම කච්චේරියෙහි මුදලින් තැන්පත්කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයෙහි අත්සන් කිරීමටත්, තොටුපල් රේන්ද විකුණු දින සිට දින 14 ක් ඇතුලතදී මුළු ගැනුම් මුදලින් 1/3 ක් ඇප මුදලක් වශයෙන් තැබීමටත් නියම කරනු ලැබේ. රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයට ඔහු රු. 1 ක මුද්දරයක් ඇමිණිය යුතුයි. ඉහත සඳහන් කොන්දේසි කඩ කළහොත් රේන්ද විකුණු දින රේන්දකරු විසින් තැන්පත් කළ ගැණුම් මුදලින් 1/10 ක් රාජසන්තක වනු ලැබේ.

6. මගින් ගෙනයාම සඳහා උවමනා වන සියළුම බෝට්ටු හෝ ඔරු රේන්දකරු තම වියදමින්ම සපයා ගෙන කැඩී බිඳී යා නොදී අළුත්වැඩියා කරවා ගෙන තබා ගැනීමට බැඳී සිටිය යුතුයි. යාත්‍රාව සඳහා

බෝට්ටුවල යෝග්‍යතාවත් වරකට බෝට්ටුවකින් ගෙනයා හැකි මගීන් ගණනත් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් අනුමත කරන පරිදි විය යුතුයි. ඉහත කී තොටුපල්වලින්, වැලි රොන්මඩ ආදිය නම වියදමින්ම ඉවත් කළ යුතුයි.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත සතුව ඇත.

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කළුතර කච්චේරියෙන් දැන ගත හැක.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 ඔක්තෝබර් මස 29 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

11–371—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

## 1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස31 වැනි දින දක්වා කාලය තුළ විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1973 නොවැම්බර් මස 09 වැනි දින අංක 85 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාල එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප වශයෙන් රු. 300 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ, සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පෝරමයක් ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළයුතු අතර නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1973 නොවැම්බර් මස 09 වැනි දින අංක 85 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1974 වර්ෂයට විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වූවන්ගේ ටෙන්ඩර් භාරගනු නොලැබේ.

4. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයකු විසින් එක ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර පස් දෙනෙකුට වඩා හවුල්වද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

5. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම්පස මුදුනේ ''කළුතර දිස්ත්‍රික්කයේ අංක......... දරන විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩර්, 1974'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්; හෝ

(ආ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන්, හෝ

1973 නොවැම්බර් මස 20 වැනි දිනට පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාවට පෙර සියලුම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය. මෙහි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වූවහොත් එය සනාථ කිරීමේ ලියවිලිද රැගෙන පැමිණිය යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක්ද ගෙවිය යුතුය.

7. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

8. 1974 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කළහොත් ඒ සම්බන්ධයෙන් කළුතර දිසාපතිතැනගේ අනුමැතිය ලබාගත යුතුය.

9. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 30 වැනි දින
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

### 1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| අනු පිළිවෙල අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය ප්‍රදේශය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| | | | පෙ.ව. | ප.ව. | පෙ.ව. |
| 1 ... | හොරණ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය... | හොරණ පළාත් ආණ්ඩුසභා සීමාව තුළ ... | 8.00 ... | 8.00 ... | 11.30 |
| 2 ... | පස්දුන් කෝරලය (බටහිර) ... | නෑබඩ ගම් සීමාව තුල ... | 8.00 ... | 7.00 ... | 11.30 |
| 3 ... | පස්දුන් කෝරලය (බටහිර) ... | තෙබුවන ගම් සීමාව තුල ... | 8.00 ... | 7.30 ... | 11.30 |

11–370/1—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

## 1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1973 නොවැම්බර් 09 වැනි දින අංක 85 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද රා තැබෑරුම් රේන්ද කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල් වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පත්‍ර පෝරමයක ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1973.11.09 අංක 85 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වූවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. තැබෑරුම වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල්වද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

5. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරය වම්පස මුදුනේ "කළුතර දිස්ත්‍රික්කයේ අංක 1 දරණ අළුත්ගම රා තැබෑරුමේ ටෙන්ඩරය—1974" යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවර (අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ 1973.11.20 දින පෙරවරු 8.30 ට පෙර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියලුම ටෙන්ඩර් කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බව දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක්ද ගෙවිය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නීතිපරිදි සකස්කොට හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

8. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

පී. ජී. පුංචිහේවා
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 ඔක්තෝබර් මස 30 වෙනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දිය.

1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම්

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | අළුත්ගම සුළු නගර සහා ප්‍රදේශය ... | අළුත්ගම සුළු නගර සීමාව තුළ - ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 ... | පෙ.ව. 8.30 |

සැළකිය යුතුයි.—1974 වර්ෂයට දනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපතිගෙන් අනුමැතිය ලබාගත යුතුය.

11–370/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ අරක්කු සිල්ලරට විකිණීම සඳහා 1973 නොවැම්බර් මස 09 වැනි දින අංක 85 ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප වශයෙන් මෙහි පහත දක්වෙන තැබෑරුම් ලැයිස්තුවේ (ඇ) තීරයේ සඳහන් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පෝරමයක ඉදිරිපත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1973 නොවැම්බර් මස 09 වන දින අංක 85 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද 1974 අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ.

4. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකිවන අතර, පස් දෙනෙකුට වඩා හවුල්වද, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

5. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරය වම්පස මුදුනේ "කළුතර දිස්ත්‍රික්කයේ අංක......... දරණ අරක්කු තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩරය—1974" යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.

ටෙන්ඩර් සහිත කවර—

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ,

(ආ) ලියාපදිංචි කරනු ලබන තැපෑලෙන් එවීමෙන් හෝ, 1973 නොවැම්බර් 20 වැනි දින පහත දක්වෙන උපලේඛනයේ (ඇ) තීරුවේ සඳහන් ටෙන්ඩර් නවත්වන වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි. එම වේලාවට සියලුම ටෙන්ඩර් කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

මෙහි 4 වන ඡෙදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත්, ඊට උචිතනා ලියවිලිද රැගෙන පැමිණිය යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ, ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍රිකා භාරගනු නොලැබේ.

9. 1974 වර්ෂයට දනට තැබෑරුම් පිහිටා ඇති ස්ථාන ලබාදීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කලහොත් ඒ සම්බන්ධව කළුතර දිසාපති තැනගේ අනුමැතිය ලබාගත යුතුය.

වැඩි විස්තර කළුතර කච්චේරියෙන් ලබාගත හැක.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 30 වෙනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දිය.

1974 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද අරක්කු තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටා ඇති ප්‍රාදේශීය ප්‍රාදේශය | (අ) තැබෑරුම් විවෘත කරන වේලාව | (ආ) තැබෑරුම් වසන වේලාව | (ඇ) ටෙන්ඩර් තැන්පත් මුදල | (ඈ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|---|
| | | | පෙ.ව. | ප.ව. | රු. | පෙ.ව. |
| 1 ... | කළුතර කොටමුණ ... | කලමුල්ල ගම්සීමාව තුල ... | 8.00 ... | 7.30 ... | 1,500 ... | 9.00 |
| 2 ... | කළුතර කොටමුණ ... | දියලගොඩ ගම්සීමාව තුල ... | 8.00 ... | 7.30 ... | 1,500 ... | 9.00 |
| 3 ... | බේරුවල පලාත් ආණ්ඩුවේ අංක 1 දරණ කොට්ඨාශය තුල | බේරුවල පලාත් ආණ්ඩු සීමාවේ අංක 1 දරණ කොට්ඨාශය තුල | 8.00 ... | 7.30 ... | 1,500 ... | 9.00 |
| 4 ... | පානදුර ... | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 8 දරණ කොට්ඨාශය තුල (වලපල පට්ටිය) | 8.00 ... | 8.00 ... | 2,000 ... | 9.00 |
| 5 ... | පානදුර කොටමුණ ... | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 6 දරණ කොට්ඨාශය තුල (නල්ලුරුව) | 8.00 ... | 8.00 ... | 2,000 ... | 9.00 |

11–370/3—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

සුරා 51/73.

## රා රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය—1974

1973 නොවැම්බර් මස 09 වැනි දින අංක 85 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන, රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දක්වෙන තැබෑරුම්වල 1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත දක්වෙන කායඪාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් කළ එවිය යුත්තේ පහත පෙනෙන "ඒ" තීරයේ එක් එක් තැබෑරුමට කෙලින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක්ද සමගය. ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් ලබාගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැතිනම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළයුතුය. එසේ නැතිනම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත්පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි—

(ඒ) ඕනෑම කච්චේරියකින් ;

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කායඪාලයෙන් ;

(සී) කොළඹ සුරාබදු මණ්ඩල කායඪාලය ;

(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කායඪාලය ;

(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කායඪාලය .

3. සීල් තබන ලද කවරයක බහා ලූ එක් එක් ටෙන්ඩර්පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ " අංක...........දරණ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය, 1974 " යනුවෙන් සඳහන් කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපැලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හිදී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කච්චේරියට පැමිණ සිටිය යුතුය.

4. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රා රේන්ද විකිණීම කොන්දේසි ප්‍රකාර, 9 වෙනි කොන්දේසිය යටතේ වරප්‍රසාද විකිණීමේ කොන්දේසිය අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් දිසාපතිතැනට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උඩමහා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

6. 1974 වර්ෂය සඳහා දනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේදයි කිව නොහැක. සෑම ස්ථානයක්ම කොළඹ දිසාපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

7. එකක් හෝ සියළුම ටෙන්ඩර්, එසේ කිරීමට කිසි කරුණක් නොදන්වාම ප්‍රතික්ෂේප කිරීමේ බලය දිසාපතිතුමාට තිබේ.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ලබාගත හැක.

9. වැදගත්.—1973 නොවැම්බර් මස 26 වෙනි දින විකිණීමට නොහැකි රා තැබෑරුම් රේන්ද, 1973 දෙසැම්බර් මස 06 වෙනි දින නැවත විකුණනු ලැබේ.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 නොවැම්බර් මස 02 වැනි දින,
කච්චේරිය, කොළඹ 12.

ඉහත කී තැබෑරුම

**අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව—කොළඹ දිස්ත්‍රික්කය**

කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව පෙරවරු | (ඇෆ්) තැබෑරුම වසන වේලාව පස්වරු | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (කෝටබෝම්) | පෙදෙස මෙසේ සීමා වී තිබේ :—උතුරට : ස්කිනර් පාරේ දකුණු පෙදෙස් සන්ධියේ සිට, කෝටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වාත්ය ; නැගෙනහිරට : ලැස්කැරින් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්ධියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය ; දකුණට : එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස, කෝටබෝම් වීදිය සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වා පෙදෙස, සහ බටහිරට : එකී සන්ධියේ සිට කෝටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස, ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්ධිය දක්වාවූ පෙදෙසක්ය. | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | 73.11.26 |
| 2 ... | නො. 5 කොට්ඨාශය කොටහේන බටහිර (ස්කිනර්ස් පාර) | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස, පිකරින් පාරේ සහ කෝට හේන වීදියේ සන්ධිය දක්වාවූ පෙදෙස | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | 73.11.26 |
| 3 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය, ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා, අලුත් මාවත පාර සහ සාන්ත ඇන්ඩෲ පාරේ සන්ධිය දක්වා, (බී) සාන්ත ඇන්ඩෲ පාර පෙදෙස් සන්ධිය දක්වා, ඉහළ සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂල් වීදියේ සන්ධිය දක්වා, (සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා, මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, (ඩී) සාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධිය දක්වා, මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා, (ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එලි පටුමග සහ පහළ සාන්ත ඇන්ඩෲ පෙදෙස් සන්ධිය දක්වාත්ය. | එම ... | 9.00 ... | 9.00 ... | 4,000 ... | එම |
| 4 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාර දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගහ දක්වා ; නැගෙනහිරට : ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට : මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ දනියෙල් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා ; මාදම්පිටිය පාරේ සහ ගිනමුල්ල පටුමගේ සන්ධිය දක්වාත්ය. | එම ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා ; නැගෙනහිරට : නාගලගම් වීදියේ දකුණු පෙදෙස් සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට : මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා ; නාගලගම් වීදිය සහ ලූකස් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාය. | එම ... | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |

කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික පෙදෙසින් පිට)

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඊ) තැබෑරුම විවෘත කරන වේලාව පෙරවරු | (ඇෆ්) තැබෑරුම වසන වේලාව පස්වරු | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 6 ... | හැඳල සුළු නගර සභාව, කොට්ඨාශ අංක 4 | හැඳල සු.න. අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස් යාය ගමේ පමණක් | 10.00 ... | 8.00 ... | 8.00 ... | 4,000 | ...73.11.26 |
| 7 ... | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් ... | එට ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 8 ... | කඳාන සුළු නගර සභාව, කොට්ඨාශ අංක 2 | කඳාන සු.න. අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | එම ... | 7.00 ... | 7.00 ... | 3,000 ... | එම |
| 9 ... | ජාඇල නගර සභාව, කොට්ඨාශ අංක 6 | ජාඇල නගර සභාව, කොට්ඨාශ අංක 6, හෙට්ටිගම-වැලිගම්පිටිය ගමේ පමණක් | එම ... | 7.30 ... | 7.30 ... | 3,000 ... | එම |
| 10 ... | ජාඇල නගර සභාව, කොට්ඨාශය අංක 1 | ජාඇල නගර සභාව, කොට්ඨාශ අංක 1 කණුවන ගමේ පමණක් | එම ... | 7.30 ... | 7.30 ... | 3,000 ... | එම |
| 11 ... | දකුණු අළුත්කුරු කෝරළේ | ඒකල මෙගොඩ බෝලන්ද ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 2,000 ... | එම |
| 12 ... | එම ... | බෝපිටිය ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 2,000 ... | එම |
| 13 ... | එම ... | මහවත්ත ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,000 ... | එම |
| 14 ... | එම ... | දඩුගම ගමේ පමණක් ... ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,000 ... | එම |
| 15 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | සිත්තප්පාඩුව ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 16 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | බසියාවත්ත ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 17 ... | එම ... | පිටිපන ගමේ පමණක් ... ... | එම ... | 7.00 ... | 7.00 ... | 4,000 ... | එම |
| 18 ... | එම ... | මූකලන්ගමුව ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 2,000 ... | එම |
| 19 ... | එම ... | කටුනායක ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 20 ... | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 11 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 11 කුරණ ගමේ පමණක් | එම | 9.00 ... | 9.00 ... | 1,500 ... | එම |
| 21 ... | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 10 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 10 මහ වීදියේ බෝලවලාන ගමේ පමණක් | එම | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 22 ... | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 3 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 3 කාමච්චෝඩි ගමේ පමණක් | එම | 9.00 ... | 9.00 ... | 5,000 ... | එම |
| 23 ... | මීගමුව මහ නගර සභාව, කොටයාශ අංක 9 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 9 උඩයාර්තොප්පු ගමේ පමණක් | එම | 9.00 ... | 9.00 ... | 1,000 ... | එම |
| 24 ... | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 5 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 5 කුඩාපාඩුව ගමේ පමණක් | එව ... | 9.00 ... | 9.00 ... | 1,500 ... | එම |
| 25 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | දළුපොත ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,500 ... | එම |
| 26 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | පෝරුතොට ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 500 ... | එම |
| 27 ... | කොච්චිකඩේ සුළු නගර සභාව, කොටයාශ අංක 1 | කොච්චිකඩේ සු.න. සභාව, අංක 1 කොට්ඨාශයේ සීමාව තුළ පමණක් | එම ... | 7.00 ... | 7.00 ... | 500 ... | එම |
| 28 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | නැගෙනහිර පළහතුරේ ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,000 ... | එම |
| 29 ... | එම ... | ඇත්ගාල ගමේ පමණක් ... ... | එම ... | 7.00 ... | 7.00 ... | 500 ... | එම |
| 30 ... | එම ... | නැගෙනහිර කටාන ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 2,000 ... | එම |
| 31 ... | එම ... | බම්බුකුලිය ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 500 ... | එම |
| 32 ... | එම (බී) ... | දෙමන්හන්දියේ ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 500 ... | එම |
| 33 ... | දිවුලපිටිය ප්‍රා.ආ.නි. කොට්ඨාශය | දගොන්න ගමේ පමණක් ... | එම ... | 7.00 ... | 7.00 ... | 1,000 ... | එම |

11–379/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## අරක්කු රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය—1974

සුරා 52/73.

1974 ජනවාරි 1 වන දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා (මාස 12 කාලය) ඇති තනි අයිතිය පිට, පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මෙහි දක්වෙන අරක්කු තැබෑරුම්වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(i) අංක 85 හා 73.11.09 දරණ රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි.

(ii) සුරා බදු බලපත්‍ර සම්බන්ධව දනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත ෆෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන "එච්" තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුලත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැතිනම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගුවේ.

රේන්ද කාලය අවසන් වීමට පෙර, වක්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතුය. එසේ නැතිනම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි.

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබද්ද කායණාලයෙන්,

(සී) කොළඹ සුරාබද්ද මණ්ඩල කායණාලය,

(ඩී) කළුතර සුරාබද්ද මණ්ඩල කායණාලය,

(ඊ) හලාවත සුරාබද්ද මණ්ඩල කායණාලය,

3. සිල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර් පත් ඇතුලත් කවරයේ උඩ වම්පස කෙළවරේ "අංක :..........දරණ අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය 1974" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම්දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9 (1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල දිසාපති තුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක්වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබද්ද බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහතකී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපයද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තුමාට තිබේ.

7. 1974 වර්ෂය සඳහා දනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකිවේදැයි කිව නොහැක. සෑම ස්ථානයක්ම කොළඹ දිසාපති තුමා ගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබා ගත හැක.

9. **වැදගත්.**—1973.12.13 වෙනි දින විකිණීමට නොහැකිවූ අරක්කු තැබෑරුම් රේන්ද 1973.12.20 වෙනි දින නැවත විකුණනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

කොළඹ කච්චේරිය,
1973 නොවැම්බර් මස 02 දින.

කොළඹ දිස්ත්‍රික්කය

ඉහත දක්වූ අනුමත කළ තැබෑරුම් ලැයිස්තුව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඇෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව පෙරවරු | (ජී) තැබෑරුම් වසන වේලාව පස්වරු | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 .. | නො. 27 කොට්ඨාශය ... බම්බලපිටිය (කොල්ලුපිටිය) | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—ස්කූල් පටුමගේ සහ කොල්ලුපිටිය පටුමගේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට ගාලු පාරේ නැගෙනහිර පෙදෙස දක්වා සහ සාන්ති කිල්ඩා පටුමගේද, 14 වෙනි පටුමගේ ද සන්ධිය දක්වා එම සන්ධියේ සිට ගාලු පාරේ බටහිර පෙදෙස ද වෙත් | 73.12.13... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 4 ... | නො. 5 කොට්ඨාශය ... කොටහේන බටහිර (පිකරින්ස් පාර) | පෙදෙස මෙසේ සීමාවී තිබේ—උතුරට: කොලේජ් වීදියේ දකුණු පෙදෙස ; අළුත් මාවත පාර සහ කොටහේන වීදියේ සන්ධියේ සිට වූ පෙදෙස ; නැගෙනහිරට: කොටහේන වීදියේ බටහිර පෙදෙසේ සිට කොලිජ් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස උතුරුස්කිනර්පාරේ පළමුකී සන්ධිය දක්වා වූ පෙදෙස ; දකුණට : උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එම සන්ධියේ සිට කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස; බටහිරට ; අළුත් මාවත පාරේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට කෝටබෝන් වීදියේ නැගෙනහිර පෙදෙස සහ කොලේජ් වීදියේ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ නැගෙනහිර පෙදෙස | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 6 ... | නො. 3 කොට්ඨාශය ... මාදම්පිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට : නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා, එමසන්ධියේ සිට පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙනහිරට : මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට නාගලගම් වීදියේ බටහිර පෙදෙස ; දකුණට ; ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා පෙදෙස ; එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස ; බටහිරට : මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා පෙදෙස ; එම සන්ධියේ ලූකස් පාරේ නැගෙනහිර පෙදෙස වෙත් | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (කැබැරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඇෆ්) කැබැරුම් විවෘත කරන වේලාව පෙරවරු | (ජී) කැබැරුම් වසන වේලාව පස්වරු | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| 3 ... | නො. 5 කොට්ඨාශය කොටහේන බටහිර (ජම්පටා වීදිය) ... | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—උතුරට : ලැස්කරින් වීදියේ සහ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා ද එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙස ; නැගෙනහිරට : ජම්පටා වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා සහ එම සන්ධියේ සිට ලැස්කරින් වීදියේ බටහිර පෙදෙස ; දකුණට : කෝටබෝන් වීදියේ සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස ; බටහිරට : උතුරු ස්කිනර් පාරේ සහ ජම්පටා වීදියේ හන්දිය දක්වා | 73.12.13 ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 7 ... | නො. 3 කොට්ඨාශය මාදම්පිටිය (පර්ගියුෂන් පාර) ... | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—උතුරට : ගඟ දක්වාවූ මට්ටක්කුලිය පල්ලිය පාරේ පෙදෙස සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය සිට වූ පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස ; නැගෙනහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එම සන්ධියේ සිට ලූකස් පාරේ බටහිර පෙදෙස ; දකුණට : දනියෙල් පාරේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස ; බටහිරට : හීනමුල්ල පටුමගේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙස ද වෙත් | එම් ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 5 ... | නො. 2 කොට්ඨාශය මෝදර ... | පෙදෙස් මෙසේ සීමාවී තිබේ :—උතුරට : මෝදර වීදියේ සන්ධියේ සිට වෙරළාසන්න පෙදෙස සහ එම සන්ධියේ සිට ටෙම්පල් පාරේ දකුණු පෙදෙස ද ; අළුත් මාවත පාර සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එහි සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ; නැගෙනහිරට : මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එහි සිට අළුත් මාවත පාරේ බටහිර පෙදෙස ; දකුණට : වෙරළාසන්න පෙදෙසේ සිට අළුත් මාවත පාරේ සන්ධිස දක්වා සහ එහි සිට මාෂල් වීදියේ උතුරු පෙදෙස ද ; බටහිරට : මාෂල් වීදියේ සහ ටෙම්පල් පාර අතර වූ වෙරළාසන්න කොටස ද වෙත් | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 1 ... | මොරටුව නගර සභාවේ අංක 9 කොට්ඨාශය (දිගරොල්ල) | මොරටුව නගර සභා ප්‍රදේශයේ අංක 9 කොට්ඨාශයේ දිගරොල්ල ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 14 ... | ජාඇල නගර සභාවේ අංක 1 කොට්ඨාශය | ජාඇල නගර සභා ප්‍රදේශයේ කනුවන උතුර අංක 1 කොට්ඨාශයේ කනුවන ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 8.00 ... | 5,000 |
| 9 ... | බටහිර සියනෑ කෝරළේ (අ.ප.) | නුවර පාරෙන් හැරී යාර 400 කුට නොඅඩු දුරින් කඩවත–රාගම පාරේ දෙපස පිහිටි කරගහමුන පහළ ගමේ පමණක් | එම | 10.00 ... | 8.00 ... | 7.00 ... | 5,000 |
| 23 ... | මීගමුව මහා නගර සභාව අංක 8 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 8 කොට්ඨාශයේ උඩයාර්තෝප්පු ගමේ පමණක් | එම ... | 10.00 ... | 10.00 ... | 9.00 ... | 5,000 |
| 10 ... | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 8 කොට්ඨාශයේ කෙරගෙපොකුණ ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 12 ... | කඳාන සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 9.00 ... | 5,000 |
| 8 ... | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශය | හැඳල සුළු නගර සභාවේ අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස්යාය ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 8.00 ... | 5,000 |
| 13 ... | ජාඇල නගර සභාවේ අංක 6 කොට්ඨාශය | ජාඇල නගර සභා ප්‍රදේශයේ අංක 6 කොට්ඨාශයේ වැලිගම්පිටිය ගමේ පමණක් | එම ... | 10.00 ... | 9.00 ... | 8.00 ... | 3,000 |
| 22 ... | මීගමුව මහා නගර සභාව අංක 10 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 10, මහවීදිය කොට්ඨාශයේ බෝලවලාන ගමේ පමණක් | එම ... | 10.00 ... | 10.00 ... | 9.00 ... | 2,000 |
| 19 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කටුනායක ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 2,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් ගාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | බිබිබි | | | පෙ.ව. | පෙ.ව. | ප.ව. | රු. |
| 16 ... | දකුණු අළුත්කුරු කෝරළේ | බෝපිටිය ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 2,000 |
| 28 ... | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශය | කොච්චිකඩේ සුළු නගර සභාවේ අංක 3 කොට්ඨාශයේ සීමාව තුල පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,000 |
| 25 ... | මීගමුව මහා නගර සභාව අංක 5 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 5 කොට්ඨාශයේ පෙරියමුල්ල ගමේ පමණක් | එම ... | 10.00 ... | 10.00 ... | 9.00 ... | 1,500 |
| 18 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | සීදූව ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,500 |
| 21 ... | මීගමුව මහා නගර සභාව අංක 11 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 11 කොට්ඨාශයේ කුරණ ගමේ පමණක් | එම ... | 10.00 ... | 10.00 ... | 9.00 ... | 2,000 |
| 15 ... | දකුණු අළුත්කුරු කෝරළේ | දඩුගම ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,500 |
| 20 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | පිටිපන ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,000 |
| 24 ... | මීගමුව මහා නගර සභාව අංක 4 කොට්ඨාශය | මීගමුව නාගරිකයේ අංක 4 වැල්ලවීදිය කොට්ඨාශයේ කුඩාපාඩුව ගමේ පමණක් | එම ... | 10.00 ... | 10.00 ... | 9.00 ... | 1,000 |
| 31 ... | දිවුලපිටිය ප්‍රා. ආ. නි. කොට්ඨාශය | දගොන්න ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,500 |
| 11 ... | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,000 |
| 26 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කඳවල ගමේ පමණක් | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 500 |
| 27 ... | එම ... | දළුවාකොටුව ගමේ පමණක් ... | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,000 |
| 17 ... | දකුණු අළුත්කුරු කෝරළේ සහ උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කැපුන්ගොඩ ගමේ පමණක් ... | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 1,000 |
| 30 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | හේනේමුල්ල ගමේ පමණක් ... | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 250 |
| 29 ... | එම ... | ඇත්ගාල ගමේ පමණක් ... | එම ... | 10.00 ... | 8.00 ... | 7.00 ... | 250 |

11–379/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සුරා 53/7 .

**රට බීම තැබෑරුම් රේන්ද විකිණීම, 1974—කොළඹ දිස්ත්‍රික්කය**

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රට බීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(i) 1973.11.09 දින හා අංක 85 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන රට බීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සුරාබද්ද බලපත්‍ර සම්බන්ධව දැනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන 'බී' තීරයේ, එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගම, ප්‍රාදේශීය ආදායම් නිලධාරින්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කර ගත් කිසිදු දේපොලක් විකුණා නැති නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැතිනම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි.

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබද්ද කායාීලයෙන්,

(සී) කොළඹ සුරාබද්ද මණ්ඩල කායාීලයය,

(ඩී) කළුතර සුරාබද්ද මණ්ඩල කායාීලයය,

(ඊ) හලාවත සුරාබද්ද මණ්ඩල කායාීලයය.

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුයි. "1974 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ අංක ... දරණ රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි". ටෙන්ඩර් පත්‍ර තැබෑරුමේ නමට කෙළින් පහත දී තිබෙන වේලාවන් සහ දිනයන්හිදී ලැබෙනසේ කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමාට එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රටබීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර 9 වැනි කොන්දේසියේ වරප්‍රසාද යටතේ විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවිය යුතුයි.

5. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වූ විට, රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමිවන අතර, වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම් සුරාබද්ද බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර, විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය දිසාපති තුමාට තිබේ.

7. 1974 වර්ෂය සඳහා දැනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබා ගත හැකි වේදැයි කිව නොහැක. සෑම ස්ථානයක් ම කොළඹ දිසාපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුය.

8. අනුමත කරන ලද රට බීම තැබෑරුම් ලැයිස්තුව පහත දක්වේ :—

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) කොට්ඨාශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස) | (ඩී) විවෘත කරන වේලාව | (ඊ) වසන වේලාව | (එෆ්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (ජී) ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| (1) ... | නො. 9 කොට්ඨාශය මොරටුව පළාත් ආණ්ඩු සභාව | මොරටුව පළාත් ආණ්ඩු සභාවේ නො. 9 කොට්ඨාශයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 9... | ප.ව. 9... | 5,000... | පෙ.ව. 10... | 73.12.06 |
| (2) ... | නො. 13 කොට්ඨාශය, කොටුව | (ඒ) ක්වීන් වීදියේ සහ යෝක් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිටවූ බෙලි වීදියේ දෙපස පෙදෙස<br>(බී) කැනල් රෝ සහ චර්ච් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට වූ යෝක් වීදියේ බටහිර පෙදෙස<br>(සී) යෝක් වීදියේ සහ ෆ්ලැග්ස්ටාෆ් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිටවූ චැතැම් වීදියේ දෙපස පෙදෙස, චර්ච් වීදියේ සහ චැතැම් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධිය සිටවූ ක්වීන් වීදියේ නැගෙනහිර පෙදෙස | පෙ.ව. 9... | ප.ව. 9... | 4,000... | එම ... | එම |
| (3) ... | නො. 2 කොට්ඨාශය, මෝදර | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—උතුරට : අළුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ද; නැගෙනහිරට : පහළ සාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ බටහිර පෙදෙස ද; දකුණට : සාන්ත ඇන්ඩෘගේ පාරේ සහ අළුත් මාවත පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට පහළ සාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ උතුරු පෙදෙස ද ; බටහිරට : මාෂල් වීදියේ සහ පහළ ශාන්ත ඇන්ඩෘගේ පෙදෙසේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට සාන්ත ඇන්ඩෘ පාරේ නැගෙනහිර පෙදෙස සහ මාදම්පිටිය හා මාෂල් වීදියේ සන්ධිය දක්වා එය සන්ධියේ සිට වූ මෝදර වීදියේ නැගෙනහිර පෙදෙසත්ය | පෙ.ව. 9... | ප.ව. 9... | 2,000... | එම ... | එම |
| (4) ... | නො. 3 කොට්ඨාශය මාදම්පිටිය | වේල්ස් කුමාර මාවතේ සහ ස්ටේස් පාරේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ සාන්ත ජෝශප් වීදියේ දෙපස පෙදෙස | පෙ.ව. 9... | ප.ව. 9... | 1,000... | එම ... | එම |
| (5) ... | නො. 6 කොට්ඨාශය, පෑලියගොඩ පළාත් ආණ්ඩු සභාව | පෑලියගොඩ පළාත් ආණ්ඩු සභාවේ පෑලියගොඩ උතුර නො. 6 කොට්ඨාශය, පෑලියගොඩ ගමේ පමණක් | පෙ.ව. 10... | ප.ව. 9... | 3,000... | එම ... | එම |
| (6) ... | නො. 8 කොට්ඨාශය, මීගමු නාගරිකය | මීගමු නාගරිකයේ නො. 8 කොට්ඨාශයේ කුන්ඩන්විල පමණක් | පෙ.ව. 10... | ප.ව. 9... | 2,000... | එම ... | එම |

9. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

10. වැදගත්.—1973.12.06 වෙනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 1973.12.20 වෙනි දින නැවත විකුණනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 නොවැම්බර් මස 02 දින,
කොළඹ කච්චේරියේ දීය.

11—379/3—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1974 වර්ෂය සඳහා රා සහ අරක්කු රේන්ද විකිණීම

1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනි දින දක්වාවූ කාලය සඳහා මෙහි පහත උප ලේඛනයෙහි දක්වා ඇති රා සහ අරක්කු තැබෑරුම්වල රා සහ අරක්කු විකිණීමේ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා සුරාබද්ද කොමසාරිස් විසින් අද දින මෙම ගැසට් පත්‍රයෙහි පලකර ඇති රා සහ අරක්කු විකිණීම පිළිබඳ කොන්දේසිවලටද දැනට බලපවත්නා සියළුම සුරාබද්ද කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1973 නොවැම්බර් මස 24 වැනි දිනදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. රා සහ අරක්කු රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත්වන අය නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාර පැහැදිලි ලෙස සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා සහ අරක්කු තැබෑරුම් ලැයිස්තුවෙහි නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සි සහද, ප්‍රකාශිත රා සහ අරක්කු රේන්ද කොන්දේසි පරිදි වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබාහලද කවරයක බහා එහි මුහුනත් වම් කෙලවරෙහි කමින් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නමද පැහැදිලිව ලියා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීමෙන් දිසාපති වෙත ලැබීමට සැලැස්විය හැක.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම හෝ සංශෝධනයක්ම ටෙන්ඩර් කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළයුතුය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1973 නොවැම්බර් මස 24 වැනි දිනදී සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියට පැමිණිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතුය.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත්කළ අය ඔහු ගැණුම්කරු වශයෙන් ප්‍රකාශවූ දින දවල් 12 ට පෙර දිසාපති විසින් නියම කරනු ලබන මුදලක් ඇප වශයෙන් තැන්පත්කොට තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

කච්චේරිය, කුරුණෑගල.
1973 ඔක්තෝබර් මස 31 වැනි දින දී ය.

උපලේඛනය

1974 වර්ෂයට අනුමත කරණලද අරක්කු තැබෑරුම්

| තැබෑරුමේ අංකය | තැබෑරුමේ නම | පිහිටි කොට්ඨාශය | තැබෑරුම පිහිටවියයුතු ප්‍රාදේශීය කොට්ඨාශය | විවෘත කරන වේලාව | වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | කට්ටිම්හන ... | කටුගම්පොල හත්පත්තුව ... | කට්ටිම්හන ගම තුල ... ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 |
| 2 ... | දූනකදෙණිය ... | එම ... | දූනකදෙණිය ගම තුළ ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 3 ... | යක්විල ... | එම ... | යක්විල ගම තුල ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 4 ... | කුරුණෑගල ... | කුරුණෑගල නගරසභාව ... | කුරුණෑගල නගර සභාවේ අංක 2, 3, 4, 5, 6, 8 හා 9 යන කොට්ඨාශතුල. එහෙත් එස්පල නෝඩ් වීදිය හා මහ වීදියේත් හා බස් නැවතුම්පලට යාබදව ඇති පාරවල්වලටත් පිටස්තරව පිහිටා ඇති ස්ථානයක | ,, 8.00 ... | ,, 8.00 |
| 5 ... | මාවතගම ... | වැඩවිල්ලි හත්පත්තුව ... | මාවතගම ගමතුල ... ... | ,, 8.00 ... | ,, 8.00 |
| 6 ... | ගිරිඋල්ල ... | කටුගම්පොල හත්පත්තුව ... | මල්ගමුව ගමතුල ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 7 ... | නාරම්මල ... | දඹදෙණි හත්පත්තුව ... | නාරම්මල සුළු නගර සභාවතුල ... | ,, 8.00 ... | ,, 7.00 |

1974 වර්ෂයට අනුමතකරණලද රා තැබෑරුම්

| තැබෑරුමේ අංකය | තැබෑරුමේ නම | පිහිටි කොට්ඨාශය | තැබෑරුම පිහිටවියයුතු ප්‍රාදේශීය කොට්ඨාශය | විවෘතකරණ වේලාව | වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | ගිරිඋල්ල ... | කටුගම්පොල හත්පත්තුව ... | මල්ගමුව ගමතුල ... ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 |
| 2 ... | උඩුබද්දව ... | එම ... | උඩුබද්දව ගමතුල ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 4 ... | නාරම්මල ... | දඹදෙණි හත්පත්තු ... | නාරම්මල ගමතුල ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 5 ... | කටුපිටිය ... | වැඩවිල්ලි හත්පත්තුව ... | කටුපිටිය ගමතුල ... ... | ,, 8.00 ... | ,, 7.00 |
| 6 ... | කුරුණෑගල ... | කුරුණෑගල නගර සභාව ... | කුරුණෑගල නගර සභාවේ අංක 1, 9, 10, 11 හා 12 යන කොට්ඨාශතුල | ,, 8.00 ... | ,, 8.00 |

ටෙන්ඩර් තැන්පත් මුදල් සහ ටෙන්ඩර් වසන වේලාව—අරක්කු තැබෑරුම්

| තැබෑරුමේ අංකය | තැබෑරුමේ නම | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|---|
| 1 | ... කට්ටිම්හන අරක්කු තැබෑරුම ... ... ... | 500 0 | ... පෙ.ව. 9.30 |
| 2 | ... දූනකදෙණිය අරක්කු තැබෑරුම ... ... ... | 500 0 | ... ,, ,, |
| 3 | ... යක්විල අරක්කු තැබෑරුම ... ... ... | 3,000 0 | ... ,, ,, |
| 4 | ... කුරුණෑගල අරක්කු තැබෑරුම ... ... ... | 5,000 0 | ... ,, ,, |
| 5 | ... මාවතගම අරක්කු තැබෑරුම ... ... ... | 2,000 0 | ... ,, ,, |
| 6 | ... ගිරිඋල්ල අරක්කු තැබෑරුම ... ... ... | 5,000 0 | ... ,, ,, |
| 7 | ... නාරම්මල අරක්කු තැබෑරුම ... ... ... | 5,000 0 | ... ,, ,, |

ටෙන්ඩර් තැන්පත් මුදල් සහ ටෙන්ඩර් වසන වේලාව—රා තැබෑරුම්

| තැබෑරුමේ අංකය | තැබෑරුමේ නම | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|---|
| 1 | ... ගිරිඋල්ල රා තැබෑරුම ... ... ... | 1,000 0 | ... පෙ.ව. 11.00 |
| 2 | ... උඩුබද්දාව රා තැබෑරුම ... ... ... | 250 0 | ... ,, ,, |
| 4 | ... නාරම්මල රා තැබෑරුම ... ... ... | 1,000 0 | ... ,, ,, |
| 5 | ... කටුපිටිය රා තැබෑරුම ... ... ... | 1,000 0 | ... ,, ,, |
| 6 | ... කුරුණෑගල රා තැබෑරුම ... ... ... | 3,000 0 | ... ,, ,, |

11–401—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

මහනුවර දිස්ත්‍රික්කයේ 1974 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1973 නොවැම්බර් මස 09 සහ අංක 85 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1974 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුලදී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 1974 වර්ෂය තුලදී පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාද යන් මිළදී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන විසින් 1973 නොවැම්බර් මස 22 වෙනි දින පස්වරු 1.30 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස්විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම කච්චේරියක පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත්කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදියයුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය :—

(i) ටෙන්ඩර් පත්‍රය මුලුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන්ද ලිවිය යුතුය. තවද, නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතුය.

(2) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් සහ දිනය යොදා සහතික කර තිබිය යුතුය. මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද කච්චේරි කුවිතාන්සියක්, වත්කම් සහතිකයත් සමඟ ලියුම් කවරයක බහා මුද්‍රාතබා ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ '' තැබෑරුමේ අංකය සහ නම '' සඳහන් කර මහනුවර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීමට අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ ලියාපදිංචිකළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවෙන් හිඳී සියළුම ටෙන්ඩර් කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය '' වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා '' යයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2 ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට යටකී රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් 'ගෙවීම සඳහා' යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ 'ආරක්ෂිත චෙක්පත්' නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු වේ.

6. මේ සම්බන්ධ වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

ඇස්. මාරලන්ද,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන.

1973 ඔක්තෝබර් මස 31 වනදා,
මහනුවර කච්චේරියේ දීය.

උපලේඛනය

**1974 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| අනුක්‍රමික අංකය සහ නම | කොට්ඨාශය | තැබෑරුම් පිහිටවිය යුතු කොට්ඨාශය | තැබෑරුම — විවෘත වේලාව පෙරවරු | තැබෑරුම — වසන වේලාව පස්වරු | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| 1—වටපුළුව ... | මහනුවර නගරයේ අංක 19—මහයාය සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාශය | කටුගස්තොට පාරේ, එම පාර සහ ත්‍රිකුණාමළ විදිය මංසන්ධියටත් කටුගස්තොට පාර සහ වට්ටාරන් තැන්න පාර මංසන්ධිය අතර පාර, මහනුවර නාගරිකයේ අංක 19—මහයාය සහ අංක 7—මාපනාවතුර ඡන්ද කොට්ඨාශයන් තුළ පිහිටි ප්‍රදේශය | 8.00 ... | 7.30 | 1973.11.22 වනදා ප.ව. 1.30 |
| 2—වහුගේපිටිය .... | උඩ පළාත ... | වහුගේ පිටිය ගම තුළ ... ... | 7.30 ... | 7.00 | |
| 3—පුස්සැල්ලාව ... | පුස්සැල්ලාව සුළු නගර සභාව | පුස්සැල්ලාව සුළු නගර සභාවේ සීමාව තුළ ... | 7.30 ... | 7.00 | |

**ටෙන්ඩර් නොකළ යුතු වතු කැන්ටීන්**

4—උඩ පළාත ... අංක 2 දරණ වතු කැන්ටීම, ගලහ, පුපුරැස්ස, වතුයායේ මායිම් තුළ ... විකිණීමේ වේලාවන් වතු අධිකාරිගේ අභිමතය පරිදිය.
5—උඩ දුම්බර ... අංක 3 දරණ වතු කැන්ටීම, මැද මහනුවර, වුඩසයිඩ වතුයායේ මායිම් තුළ එම

**රා තැබෑරුම් රේන්ද සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල්**

| රා තැබෑරුම | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|
| අංක 1—වටපුළුව රා තැබෑරුම ... ... ... | 5,000 |
| අංක 2—වහුගේපිටිය රා තැබෑරුම ... ... ... | 1,500 |
| අංක 3—පුස්සැල්ලාව රා තැබෑරුම ... ... ... | 3,000 |

11-504—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

**1974 වර්ෂයට අනුරාධපුර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම**

1974 වර්ෂය තුළ පහත දැක්වෙන තැබෑරුමේ අරක්කු සිල්ලරට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ.

(1) 1973.11.09 වැනි දින අංක 85 දරන ශ්‍රී ලංකා ආණ්ඩු ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි සහ

(2) සියළුම සුරාබදු නීති යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

2. මෙම කච්චේරියෙන් හෝ වෙනයම් කච්චේරියකින් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියනලද සෑම ටෙන්ඩර් පතක්ම රුපියල් 5,000 ක මුදලක් ගෙවූ බවට භාණ්ඩාගාරයෙන් හෝ කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතුයි.

3. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර්පත්‍ර සමඟ ඔවුන්ට අයත් නිශ්චල දේපල වල වටිනාකම් සහතිකයක් ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඈමිණිය යුතුයි. එක් තැබෑරුමකට ඉල්ලුම්කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට විසිපහකට අඩුවිය යුතු සහතිකයක් නොවිය යුතුය. මෙම ඡෙදයේ සඳහන්වන සහතිකයට අදාල නිශ්චල දේපල මෙකී රේන්ද කාලය තුළදී විකිණීම හෝ පැවරීම තහනම් වන්නේය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවාක්සේ සලකනු ලබත්.

4. සෑම ටෙන්ඩර් පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි උඩ වම්පය කෙළවරේ '' 1974 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන්කර 1973.12.10 වැනි දින පෙරවරු 11 ට ප්‍රථමයෙන් ලැබීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙත එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන ලද්දේ නම් ඒවා ලියාපදිංචිකළ තැපෑලෙන් හා ඉහත සඳහන් පරිදි විය යුතුය. ඉහත සඳහන් දිනයේ නියමිත වේලාවට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය.

5. සාර්ථක වූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර් පත්‍රය පිළිගත් බව දන් වූ වහාම රේන්ද විකිනීමේ කොන්දේසිවලට අත්සන්කර, දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන ලද මුදල් ගෙවිය යුතුය.

6. සාර්ථක වූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර්පත්‍රය පිළිගත් බව දන් වූ විට රේන්ද විකිනීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියමකළ ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටැන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එසේ පැහැර හරින්නාගේ නම සියලුම සුරාබදු බලපත්‍රවලට අදල පැහැරහරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටැන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසුව සියලුම ටැන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

7. ටැන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටැන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති වෙත පැවරී ඇත.

8. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තු පහත දක්වේ:—

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ... | අනුරාධපුර නව නගරයේ පළමුවන පියවර සීමාව තුළ (මාර්කට් පෙදෙස) | පෙ.ව. 8.00 ... | ප. ව. 7.00 |

9. තනි බලය ලත් තැනැත්තා විසින් 8 වැනි ඡේදයේ සඳහන් දිසාපති විසින් වෙන්කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස්කළ යුතුය, නැත්නම් ඒ වෙනුවට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන ගොඩනැගිල්ල කුලියට ගත යුතුය. දිසාපතිගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ලබාගත යුතු වරප්‍රසාදය දින 14 කට පෙර දිසාපතිතැනගෙන් ලබාගත යුතුය.

10. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අනුරාධපුර කච්චේරියෙන් ලබාගත හැකිය.

අ. පු. බ. මනම්පේරි,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

දිසාපති කාර්යාලය,
අනුරාධපුරය, 1973.11.01.

11–512/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**1974 වර්ෂයට අනුරාධපුර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

1974 වර්ෂය තුළ පහත දක්වෙන තැබෑරුමේ පැසුන රා සිල්ලරට විකිණීම සඳහා ටැන්ඩර් පත්‍ර පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ:—

(1) 1973.11.09 වැනි දින අංක 85 දරන ශ්‍රී ලංකා ආණ්ඩු ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි; සහ

(2) සියළුම සුරාබදු නීති යටතේ දනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

2. මෙම කච්චේරියෙන් හෝ වෙනයම් කච්චේරියකින් ලබාගන්නා ලද ටැන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටැන්ඩර් පතක්ම රුපියල් 1,500ක මුදලක් ගෙවූ බවට භාණ්ඩාගාරයෙන් හෝ කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් සමඟ ඉදිරිපත් කළ යුතුයි.

3. සාර්ථකවූ ටැන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර සමඟ ඔවුන්ට අයත් නිශ්චල දේපලවල වටිනාකම් සහතිකයක් ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතුයි. එක් එක් තැබෑරුමකට ඉල්ලුම් කරන ටැන්ඩර් මුදලේ වටිනාකමින් සියයට විසිපහකට අඩුවිය යුතු සහතිකයක් නොවිය යුතුය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදල නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළදී විකිණීම හෝ පැවරීම තහනම් වන්නේය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවාක්සේ සලකනු ලබත්.

4. සෑම ටැන්ඩර් පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි උඩ වම්පස කෙළවරේ "1974 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන්කර 1973.12.10 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රථමයෙන් ලැබීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙත එවිය යුතුය. ටැන්ඩර් පත්‍ර තැපැලෙන් එවන ලද්දේනම් ඒවා ලියාපදිංචි කළ තැපැලෙන් හා ඉහත සඳහන් පරිදි විය යුතුය. ඉහත සඳහන් දිනයේ නියමිත වේලාවට ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරනු ලැබේ. ඒවේලාවට සියළුම ටැන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය.

5. සාර්ථකවූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන්කර, දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන ලද මුදල් ගෙවිය යුතුය.

6. සාර්ථකවූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියමකල ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටැන්ඩර් තැන්පත් මුදල අහිමිවූ බව ප්‍රකාශ කාරනවාත් හැර එසේ පැහැර හරින්නාගේ නම සියලුම සුරාබදු බලපත්‍රවලට අදල පැහැරහරින්නන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. ජයග්‍රාහී ටැන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසුව සියලුම් ටැන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

7. ටැන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටැන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති වෙත පැවරී ඇත.

8. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දක්වේ:—

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවියයුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ... | අනුරාධපුර නව නගරයේ පළමුවන පියවර සීමාවතුල (මාර්කට් පෙදෙස) ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 |

9. තනි බලය ලත් තැනැත්තා විසින් 8 වැනි ඡේදයේ සඳහන් දිසාපති විසින් වෙන්කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස්කළ යුතුය, නැත්නම් ඒ වෙනුවට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන ගොඩනැගිල්ල කුලියට ගත යුතුය. දිසාපතිගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකලයුතු අතර, එසේ කිරීමට ලබාගත යුතු වරප්‍රසාදය දින 14 කට පෙර දිසාපතිතැනගෙන් ලබාගත යුතුය.

10. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අනුරාධපුර කච්චේරියෙන් ලබාගත හැකිය.

අ. පු. බ. මනම්පේරි,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

දිසාපති කාර්යාලය,
අනුරාධපුරය, 1973.11.01.

11–512/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

## 1974 වර්ෂයට ගාල්ල දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විනිශ්චය

1974 ජනවාරි 1 දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල අරක්කු සිල්ලරට විකිණීම සඳහා 1973 නොවැම්බර් 09 දින අංක 85 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලවී ඇති අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයන්ටම අදල එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

2. ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරම මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම සිල් තබන ලද කවරයක බහා කවරය වම් පස මුදුනේ (උපලේඛනයේ සඳහන් පරිදි) තැබෑරුමේ අංකය හා නම සටහන් කොට 1973 නොවැම්බර් 21 දින ටෙන්ඩර් භාර ගැනීම නවත්වන වේලාවට පෙර, ගාල්ලේ දිසාපතිට ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට ප්‍රථම දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1973.11.09 දින පලවී ඇති අංක 85 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන 1974 වර්ෂය සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි වලට අනුකූල විය යුතුය.

4. 1973 නොවැම්බර් 21 දින උපලේඛනයේ සඳහන් වේලාවන්හි දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කරනු ලැබේ. එකී වේලාවන්හිදී ටෙන්ඩර් කරුවන් කච්චේරියේදී පෙනී සිටිය යුතුය. ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් පත්‍ර සියල්ල විවෘත කරනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර ගාල්ලේ කච්චේරියේ දී ලබාගත හැක.

ඩබ්. ජේ. ප්‍රනාන්දු,
ගාල්ලේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 ඔක්තෝබර් මස 30 දින,
ගාල්ල, කච්චේරියේ දී ය.

ඉහත සඳහන් උපලේඛනය

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම | විවෘත කරන වේලාව | වසන වේලාව | කොට්ඨාශය | පිහිටා ඇති ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් භාර ගැනීම නවත්වන වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | කටුගොඩ අංක 1 දරණ අරක්කු තැබෑරුම | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 ... | ගාලු නාගරිකය ... | ගාලු/මාතර පාරේ 74¼ මයිලකනුවත් බොනාවිස්ටාවත් අතර | රු. 5,000 ... | පෙ.ව. 10.00 |
| 2 ... | හීනටිගල අංක 2 ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.00 ... | කල්පේපත්තුව ... | හීනටිගල ග්‍රාමයෙහි . | රු. 5,000 ... | පෙ.ව. 10.00 |

11–336—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ 1974 වර්ෂයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1973 නොවැම්බර් මස 09 සහ අංක 85 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1974 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත් එම කාලය තුලදී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපානා පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 1974 වර්ෂය තුලදී පහත සඳහන් උපලේඛණයෙහි සඳහන් කර ඇති විදේශීය මත්පැන් තැබෑරුම්වල විදේශීය මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයන් මිලදී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් 1973 නොවැම්බර් මස 23 වෙනි දින පෙ.ව. 9.30 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස්විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම කච්චේරියක පහත සඳහන් උපලේඛණයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ, ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය :—

(1) ටෙන්ඩර් පත්‍රය මුලුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන්ද ලිවිය යුතුය. තවද නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොද තිබිය යුතුය.

(2) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් සහ දිනය යොද සහතික කර තිබිය යුතුය. මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබා ගන්නා ලද කච්චේරි කුවිතාන්සියත්, වත්කම් සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ ''තැබෑරුමේ අංකය සහ නම'' සඳහන් කර මහනුවර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ ලියාපදිංචි කළ සීඝ්‍රගාමී තැපැලෙන් එවිය යුතුය.

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවන් හිදී සියළුම ටෙන්ඩර්කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය ''වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා'' යයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට යටකී විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් 'ගෙවීම සඳහා' යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ 'ආරක්ෂිත චෙක්පත්' නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතුවේ.

6. මේ සම්බන්ධ වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

ඇස්. මාරලන්ද,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන.

1973 ඔක්තෝබර් මස 31 වන දින,
මහනුවර කච්චේරියේ දීය.

### උපලේඛනය

### 1974 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කළ විදේශීය මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය සහ නම | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය | තැබෑරුම් විවෘත කළ යුතු වේලාව පෙ.ව. | තැබෑරුම් වැසිය යුතු වේලාව ප.ව. | 1973.11.23 වනදා ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1—කොළඹ වීදිය | මහනුවර නාගරිකයේ අංක 16—යටිනුවර සහ අංක 17—කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාශය තුළ | මහනුවර නාගරිකයේ අංක 16—යටිනුවර සහ අංක 17—කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාශය තුළ, කොළඹ වීදිය සහ කැසල්හිල් වීදියේ මංසන්ධියටත්, කොළඹ වීදියේ සහ කොළඹ පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදියේ දෙපාර්ශ්වයම | 8.00 ... | 7.30 | පෙ.ව. 9.30 |
| 2—ත්‍රිකුණාමල වීදිය | මහනුවර නාගරිකයේ අංක 18—වේවැල්පිටිය ඡන්ද කොට්ඨාශය තුළ ... | මහනුවර නාගරිකයේ අංක 18—වේවැල්පිටිය ඡන්ද කොට්ඨාශය තුළ ත්‍රිකුණාමල වීදියේ ගෝර්ඩන් ආයචීා පාරෙන් මංසන්ධියටත්, ත්‍රිකුණාමල වීදියේත් හරස් වීදියේත් මංසන්ධියටත් අතර ත්‍රිකුණාමල වීදියේ දෙපාර්ශ්වයම සහ කන්දේ වීදියේ සහ කැසල් හිල් වීදියේ මංසන්ධියටත්, කන්දේ වීදියේ සහ ත්‍රිකුණාමල වීදියේ මංසන්ධියටත් අතර කන්දේ වීදියේ දෙපාර්ශ්වයේම | 8,00 ... | 7,30 | |
| 3—පට්ටියගම ... | පාතහේවාහැට ... | පට්ටියගම-උඩගම ග්‍රාමය තුළ ... ... | 8,00 ... | 7,30 | |
| 4—පුස්සැල්ලාව | පුස්සැල්ලාව සුළු නගර සභාව ... | පුස්සැල්ලාව නගරය තුළ ... ... | 8,00 ... | 7.00 | |
| 5—නෝර්වුඩ ... | අඹගමුව කෝරළය ... | නෝර්වුඩ නගරය තුළ ... ... | 8.00 ... | 9.00 | |
| 6—දික්ඔය ... | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය තුළ | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය තුළ | 8.00 ... | 7.30 | |
| 7—දික්ඔය ... | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 7 දරණ ඡන්ද කොට්ඨාශය තුළ | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 7 දරණ ඡන්ද කොට්ඨාශය තුළ | 8.00 ... | 7.30 | |

**සංලක්ෂ්‍යය.**—තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ පෙර අනුමැතිය ලබාගත යුතුය.

### විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල්

| විදේශීය මත්පැන් තැබෑරුම | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| අංක 1—කොළඹ වීදිය විදේශීය මත්පැන් තැබෑරුම | ... | 4,000 |
| අංක 2—ත්‍රිකුණාමල වීදිය විදේශීය මත්පැන් තැබෑරුම | ... | 1,000 |
| අංක 3—පට්ටියගම විදේශීය මත්පැන් තැබෑරුම ... | ... | 1,000 |
| අංක 4—පුස්සැල්ලාව විදේශීය මත්පැන් තැබෑරුම | ... | 500 |
| අංක 5—නෝර්වුඩ විදේශීය මත්පැන් තැබෑරුම ... | ... | 1,000 |
| අංක 6—දික්ඔය විදේශීය මත්පැන් තැබෑරුම ... | ... | 1,000 |
| අංක 7—දික්ඔය විදේශීය මත්පැන් තැබෑරුම ... | ... | 1,000 |

11-506—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ 1974 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

1973 නොවැම්බර් මස 09 සහ අංක 85 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1974 වර්ෂයට හා ඊට පසු කාලපරිච්ඡෙදයන් සඳහා වලංගු අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුලදී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපානා පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 1974 වර්ෂය තුලදී පහත සඳහන් උපලේඛණයෙහි සඳහන් කර ඇති අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ වරප්‍රසාද යන් මිළදී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් 1973 නොවැම්බර් මස 22 වෙනි දින පෙ.ව. 9.30 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස්විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම කච්චේරියක පහත සඳහන් උපලේඛණයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ, ප්‍රාදේශීය ආදයම් නිලධාරීතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත කරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය :—

(1) ටෙන්ඩර් පත්‍රය මුලුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන්ද ලිවිය යුතුය. තවද, නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොද තිබිය යුතුය.

(2) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් සහ දිනය යොද සහතික කර තිබිය යුතුය. මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබා ගන්නා ලද කච්චේරි කුවිතාන්සියක්, වත්කම් සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රාතබා ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ ''තැබෑරුමේ අංකය සහ නම'' සඳහන් කර මහනුවර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ ලියාපදිංචිකළ සීඝ්‍රගාමී තැපැලෙන් එවිය යුතුය.

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවන් හිදී සියළුම ටෙන්ඩර්කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය " වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා " යයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2 ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන් විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට යටකී අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් 'ගෙවීම සඳහා' යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ 'අරාක්ෂිත චෙක්පත්' නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතුවේ.

6. මේ සම්බන්ධ වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

ඇස්. මාරලන්ද,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන.

1973 ඔක්තෝබර් මස 31 වනදා,
මහනුවර කච්චේරියේ දීය.

උපලේඛනය

ඉහත සඳහන් කළ අරක්කු තැබෑරුම් ලැයිස්තුව සහ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාවන් :—

| අනුක්‍රමික අංකය | නම සහ කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. | 1973.11.22 වනදා ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | කොළඹ වීදියේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශය | කොළඹ වීදිය සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියටත්, කොළඹ වීදිය සහ කැසල් හිල් වීදිය මංසන්ධියටත් අතර කොළඹ වීදියේ මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශයට අයත් පාර්ශ්වයේ | 8.00 ... | 7.30 | පෙ. ව. 9.30 |
| 2 ... | කටුකැලේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 16 සහ 4 දරණ කොට්ඨාශ | මහනුවර පොලිස් ස්ථානය අසල පාලමටත් කටුකැලේ මුස්ලිම් දේවස්ථානයටත් අතර පේරාදෙණිය පාරේ, මහනුවර නාගරිකයේ අංක 16 සහ 4 ට අයත් පාර්ශවයේ | 8.00 ... | 7.30 | |
| 3 ... | වහුගේපිටිය අරක්කු තැබෑරුම—උඩ පළාත | වහුගේපිටිය ග්‍රාමය තුල ... ... ... | 8.00 ... | 7.00 | |
| 4 ... | පුස්සැල්ලාව අරක්කු තැබෑරුම—පුස්සැල්ලාව නගරය | පුස්සැල්ලාව නගර සීමා ඇතුළත ... ... | 8.00 ... | 7.00 | |
| 5 ... | හැටන් අරක්කු තැබෑරුම—හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය තුල | 8.00 ... | 7.30 | |
| 6 ... | කොටියාගල අරක්කු තැබෑරුම—කොටියාගල නගරය | කොටියාගල නගර සීමාව ඇතුළත ... ... | 8.00 ... | 7.00 | |
| 7 ... | හාර්ඩන් හුයිස් අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | හාර්ඩන් හුයිස් ග්‍රාමය තුළ ... ... | 8.00 ... | 7.00 | |
| 8 ... | මස්කෙළිය අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | මස්කෙළිය නගර සීමාව තුළ ... ... | 8.00 ... | 7.00 | |
| 9 ... | පුපුරැස්ස අරක්කු තැබෑරුම—උඩපළාත | පුපුරැස්ස නගර සීමාව තුළ ... ... | 8.00 ... | 7.00 | |

ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යුතු මහනුවර දිස්ත්‍රික්කයේ වතු කැන්ටීන්

| | | | |
|---|---|---|---|
| 10 ... | උඩ පළාත ... ... | ගලහ, පුපුරාසි වතුයායේ සීමාව තුළ ... ... | වෙළඳාම් කරණ වේලාව වතු අධිකාරි විසින් නියෝග කරන පරිදිය. |
| 11 ... | උඩදුම්බර ... ... | ඌරුගල, වුඩ්සයිඩ් වතුයායේ සීමාව තුළ ... ... | එම |

සටහන.—සෑම තැබෑරුම් පවත්වන ස්ථානයක් සඳහාම මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ පෙර අනුමැතිය ලබාගත යුතුය.

අරක්කු තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් මුදල්

| අරක්කු තැබෑරුම | | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| අංක 1 කොළඹ වීදිය අරක්කු තැබෑරුම | ... | ... | 5,000 |
| අංක 2–කටුකැලේ අරක්කු තැබෑරුම | ... | ... | 5,000 |
| අංක 3–වහුගේපිටිය අරක්කු තැබෑරුම | ... | ... | 5,000 |
| අංක 4–පුස්සැල්ලාව අරක්කු තැබෑරුම | ... | ... | 1,500 |
| අංක 5–හැටන් අරක්කු තැබෑරුම ... | ... | ... | 5,000 |
| අංක 6–කොටියාගල අරක්කු තැබෑරුම | ... | ... | 3,000 |
| අංක 7–හාර්ඩන්හුයිස් අරක්කු තැබෑරුම | ... | ... | 2,000 |
| අංක 8–මස්කෙළිය අරක්කු තැබෑරුම | ... | ... | 4,000 |
| අංක 9–පුපුරැස්ස අරක්කු තැබෑරුම ... | ... | ... | 1,500 |

11—505—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**දුම්රිය හෝජනාගාර සේවය—මත්පැන් බලපත්‍ර—1974**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ ප්‍රකාර 1930 සැප්තැම්බර් 30 වැනි දින අංක 200 දරණ සුරාබදු නිවේදනයේ සඳහන් ආකාරයට, 1974 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වන බලපත්‍ර කාලසීමාව තෙක් මත්පැන් බලපත්‍ර ලබා ගැනීම සඳහා කොළඹ, කළුතර, ගාල්ල, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය, යාපනය, මන්නාරම, ත්‍රිකුණාමලය, දිසාපතිවරුන්ට සහ සුරාබදු කොමසාරිස් වෙත 1973 ඔක්තෝබර් මස 5 වැනි දින ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබෙන බව මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ඉල්ලුම් කරනලද බලපත්‍රයේ විස්තර | දනට ඇති බලපත්‍ර/බලපත්‍රය අලුත්කිරීම හෝ අලුත් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහාද | බලපත්‍ර අවශ්‍ය ව ඇති ස්ථානයේ පිහිටීම |
|---|---|---|---|
| දුම්රිය සාමාන්‍යාධිකාරි, කොළඹ 10 ... | දුම්රිය හෝජනාගාර සේවය (සිල්ලර විකිණීම) ... | අලුත් කිරීම ... | කොළඹ–කොටුව දුම්රිය ස්ථානය, කොළඹ 1 |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, මරදන |
| එම ... | එම ... | එම ... | දු. හෝජන මැදිරි සහ බෆට් රථ, කොටුව දු. ස්ථානය |
| එම ... | එම ... | එම ... | මධ්‍යම මත්පැන් ගබඩාව, කොටුව දු. ස්ථානය |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, අලුත්ගම |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, ගාල්ල |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, පොල්ගහවෙල |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, මහනුවර |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, නානුඔය |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, අනුරාධපුරය |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, යාපනය |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, තලේමන්නාරම |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, හැටන් |
| එම ... | එම ... | එම ... | දු. ස්ථානය, ත්‍රිකුණාමලය |

ඒ. ටී. ජේ. මඩුගල්ල,
වැ. බ. දුම්රිය සාමාන්‍යාධිකාරී.

කැ. පෙ. 358,
කොළඹ 10,
1973.10.23.

11–402—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | ... | 2.11.73 | සිකුරාද | ... | 24.10.73 | බදාදා | දවල් | 12.00 |
| | | 9.11.73 | සිකුරාද | ... | 31.10.73 | බදාදා | දවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 7.11.73 | බදාදා | දවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 14.11.73 | බදාදා | දවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 21.11.73 | බදාදා | දවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 7.12.73 | සිකුරාද | ... | 28.11.73 | බදාදා | දවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 5.12.73 | බදාදා | දවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 12.12.73 | බදාදා | දවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 19.12.73 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.